## මාසික මහ සභා රැස්වීම් වාර්තාව

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2026.06.09
වේලාව :- පෙ.ව. 10.00

### සහභාගිත්වය

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
16. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
17. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
18. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
19. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
20. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
21. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
22. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
23. පී.ජී.මල්ලිකා මැතිතුමිය
24. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
25. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
26. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
27. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
28. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
29. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
30. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
31. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
32. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
33. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
34. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
35. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

### නිලධාරී සහාභාගිත්වය

- ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

### ආගම සිහිකිරීම

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ). 2026.05.05 දින පැවති මාසික මහසභා වාර්තාව සම්මත කිරිම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026.05.05 දින පැවැත්වූ මාසික මහසභා රැස්වීම් වාර්තාව කියවුවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරිම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2026.05.05. දින පැවැත්වූ මාසික මහසභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**සංශෝධන**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පිටු අංක 24 හි (ඊ) 03 යටතේ තමා එම යෝජනාව ගෙන ඒමට ප්‍රධානතම හේතුව ලෙස යම් පුද්ගලයෙකු තමාට තර්ජනය කළ බැවින් බවත්, ලේකම්තුමාට සහ සභාපතිතුමන්ට ඒ සම්බන්ධව දැනුවත් කළ බවත්, ඔහුට විරුද්ධව නඩු කටයුත්තක් මේ වන විට පවතින බව ප්‍රකාශ කළ බැවින් අදාළ පුද්ගලයාගේ නම සඳහන් නොකර යෝජනාව ඉදිරිපත් කළ බවත්, එය සටහනේ නොමැති බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පිටු අංක 33 හි තමා විසින් පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ අභාවයන් සම්බන්ධව ශෝකය ප්‍රකාශ කිරීමක් සිදුකළ බවත්, නමුත් ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස් කැලුම් කුමාර මැතිතුමාගේ බිරිඳගේ මවගේ අභාවය ලෙස සටහන් වුවත් එය "රඹුක්කන ප්‍රාදේශීය සභාවේ හිටපු දෙනගමුව මන්ත්‍රීතුමාගේ බිරිඳ" ලෙස සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

පිටු අංක 12 හි තමා සිදු කළ ප්‍රකාශයෙහි සඳහන් "මනා සෞඛ්‍යයකින් යුත්" යන්න" මනා පළපුරුද්දකින් යුත්" ලෙස සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒ අනුව 2026.06.09 දිනැති මහසභා වාර්තාවේ ඉදිරිපත් කර ඇති සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරිම සුදුසු බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව 2026.06.09 දිනැති මහසභා වාර්තාව ඉදිරිපත් කරන ලද සංශෝධනයන්ට යටත්ව සභා සම්මත වූ බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ගරු සභාවට දන්වන ලදී.

**(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදන**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

01.පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/AD/1/8/7/01 හා 2026.05.25 දිනැති 2025 වර්ෂයට අදාළව නියමිත දිනට වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම සම්බන්ධ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා හැකි ඉක්මනින්( 2026 ජුනි 15ට පෙර) තම වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදෙන ලෙස දන්වා සිටින ලදී.

02.ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සමග එක්ව ජාතික ඵලදායිතා තරඟාවලියට ඉල්ලුම් කළ බවත්, එම අයදුම් පත තේරී ඇති බවත්, ඒ සඳහා ඔබතුමන්ලාගේ දායකත්වය ලබා දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

03.නගර මධ්‍යයේ ආරක්ෂාව සම්බන්ධව ගැටළුවක් පැවති බැවින් වරුණ කීර්තිරත්න මැතිතුමාගේ අනුග්‍රහයකත්වයෙන් රඹුක්කන නගර මධ්‍යයේ සී.සී.ටී.වී කැමරා පද්ධතියක් සවිකල බවත්, ඒ සඳහා ලක්ෂ 12 පමණ එතුමාගේ පෞද්ගලික ධනය යෙදවූ බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම පද්ධතියට ඇතුළත් වීමේ හැකියාව ප්‍රාදේශීය සභාවට, ශ්‍රී ලංකා පොලිසියට හා රඹුක්කන වෙළඳ සංගමයට පමණක් බවත්, මේ වන විට පරීක්ෂණ මට්ටමේ පවතින බවත්, නීති උපදෙස් ලබා ගනිමින් සිටින බවත් ,විශේෂයෙන්ම AI තාක්ෂණය සහිත

මෘදුකාංග පද්ධතියක් මෙහි පවතින බවත් ප්‍රකාශ කළ අතර එසේම උසාවි නියෝගයකට අවශ්‍ය තොරතුරු පමණක් ලබාගත හැකි බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

04.අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද අංක DG/CA/AD/144 හා 2026.04.20 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ඩෑෂ්බෝඩ් ලබාදීම සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණීම අවශ්‍ය නොවන බවත් Google Form හරහා සිදු කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

**(ඇ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමාගේ නිවාඩු ලබා ගැනිම පිළිබඳ නිවේදන ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී. සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

i. අසනීප වූ බැවින් 2026.06.09 දින පැවැත්වෙන මහසභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහසභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2026.06.09 දින පැවැත්වෙන මහසභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමාට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබාදිම සුදුසු බවට ගරු මහසභාව විසින් අනුමත කරන ලදී.

**(ඈ).සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරිම - නැත**

**(ඉ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත**

**(ඊ). යථාපරිදි කල්දී ඇති යෝජනා - ඇත**

**(ඊ).01.I.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

**i.** **රඹුක්කන ප්‍රාදේශීය සභාවේ පිටුපස වාහන අංගනයේ ඇති ට්‍රැක්ටර් යන්ත්‍ර බොහෝ ප්‍රමාණයක් මේ වන විට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය වේ. මෙම යන්ත්‍ර වාර්ෂිකව තක්සේරු කිරීමට, රක්ෂණය කිරීමට සහ ආදායම් බලපත්‍ර ලබා ගැනීමට විශාල මුදල් ප්‍රමාණයක් නිකරුණේ වැය වන බැවින් පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් එම ටැක්ටර් යන්ත්‍ර අතුරින් අපහරණයට සුදුසු යන්ත්‍ර ඉවත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ හා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

1. **මෝටර් රථ පරීක්ෂක - කෑගල්ල**
2. **සංවර්ධනය, නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ නියෝජිතයෙකු**
3. **සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ගණකාධිකාරී**
4. **රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ලේකම්**
5. **රඹුක්කම ප්‍රාදේශීය සභාවේ ප්‍රවාහන විෂය නිලධාරී**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

කාර්මික කමිටුවට යොමු කර එහි වාර්තාවක් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපහරණය කිරීම සුදුසු ද නැති ද යන්න පිළිබඳව වාර්තාවක් ලබාගත යුතු බවත්, ඒ සඳහා තාක්ෂණික දැනුමැති පුද්ගලයින්ගෙන් සමන්විත කමිටුවක් නම් කර ඇති බවත්, ඔවුන් විසින් ලබා දෙන ඇගැයීම් වාර්තාව පදනම් කරගෙන එම වාර්තාව මහ සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මහ සභා තීරණය ලබාදිය හැකි බවත්, කාර්මික කමිටුවට එම බලය නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

කාර්මික කමිටුව මගින් මෙම වාහන සම්බන්ධව නිරීක්ෂණ වාර්තාවක් ලබා දී ඇති බවත්, මෝටර්ගේඩ් එක සම්බන්ධව ස්ථානීය පරීක්ෂාවක් සිදු කළ බවත්, ඉංජිනේරු වාර්තාවේ සඳහන් වන්නේ එම යන්ත්‍රය සභාවට විශාල බරක් බැවින් අපහරණය කිරීමට බවත්, මෙම ට්‍රැක්ටර් යන්ත්‍ර ද එම වාර්තාවට ඇතුළත් කර අපහරණය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

යෝජනාවේ නම් කර ඇති කමිටුව සඳහා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගෙන් යුත් කමිටුවක්ද පත්කිරීම සුදුසු බවත්, විශේෂයෙන්ම යන්ත්‍ර සූත්‍ර පිළිබඳ දැනුම ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා වැනි මන්ත්‍රීවරුන්ගේ සහය ලබා ගැනීම ඉතා වටිනා බවත්, පක්ෂ විපක්ෂ නියෝජනය වන පරිදි කමිටුව පත්කරන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රී මණ්ඩලය නියෝජනය කරමින් පහත නම් සඳහන් මන්ත්‍රීතුමන්ලා පත් කරන බව ප්‍රකාශ කරන ලදී.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වී.ආර්.නන්දිකබණ්ඩාරනායක මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ජේ.පී.පද්මසිරි මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා

තවද,වාහන අපහරණය පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ඉහත යෝජනාවේ සඳහන් කමිටුව පත් කර ඇති බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රඹුක්කන ප්‍රාදේශීය සභාවේ පිටුපස වාහන අංගනයේ ඇති ට්‍රැක්ටර් යන්ත්‍ර බොහෝ ප්‍රමාණයක් මේ වන විට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය වේ. මෙම යන්ත්‍ර වාර්ෂිකව තක්සේරු කිරීමට, රක්ෂණය කිරීමට සහ ආදායම් බලපත්‍ර ලබා ගැනීමට විශාල මුදල් ප්‍රමාණයක් නිකරුණේ වැය වන බැවින් පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් එම ටැක්ටර් යන්ත්‍ර අතුරින් අපහරණයට සුදුසු යන්ත්‍ර ඉවත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම සුදුසු බවට වන යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර ඒ සඳහා පහත නම් සඳහන් මන්ත්‍රීතුමන්ලා ද නම් කරන ලදී.

| අනු අංකය | නිලධාරීන් | මන්ත්‍රීන්තුමන්ලා |
|---|---|---|
| 01 | මෝටර් රථ පරීක්ෂක - කෑගල්ල | ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා |
| 02 | සංවර්ධනය, නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ නියෝජිතයෙකු | ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා |
| 03 | සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ගණකාධිකාරී | ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා |

| | | |
|---|---|---|
| 04 | රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ලේකම් | ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා |
| 05 | රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ප්‍රවාහන විෂය නිලධාරී | ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා |

**ii.** **රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණයේ විදුලි සෝපානය සැපයීම, සවිකිරීම, ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම කර්මාන්තයේ 40% කොටස් මුදල වෙන රු.2,612,520.00 ක මුදල Sky Elevator Tech (PVT) LTD වෙත ගෙවීම සඳහා මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණයේ විදුලි සෝපානය සැපයීම, සවිකිරීම, ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම කර්මාන්තයේ 40% කොටස් මුදල වන රු.2,612,520.00 ක මුදල Sky Elevator Tech (PVT) LTD වෙත ගෙවීම සඳහා වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**iii.** **කැළණිය විශ්ව විද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය හදාරණය ඩී.ජී.එස්.එස්.එච්. දේදුනුපිටිය නමැති ශිෂ්‍යාව උපාධි පාඨමාලාව සඳහා අවශ්‍ය සේවය පදනම් කරගත් පුහුණුවක් රඹුක්කන ප්‍රාදේශීය සභාවේ පුස්තකාල ඒකකයෙන් ලබා ගැනීමට (පැය 300) ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීමට සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
කැළණිය විශ්ව විද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය හදාරණ ඩී.ජී.එස්.එස්.එච්. දේදුනුපිටිය නමැති ශිෂ්‍යාව උපාධි පාඨමාලාව සඳහා අවශ්‍ය සේවය පදනම් කරගත් පුහුණුවක් රඹුක්කන ප්‍රාදේශීය සභාවේ පුස්තකාල ඒකකයෙන් ලබා ගැනීමට (පැය 300) ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීමට සභා අනුමැතිය ලබා ගැනීමට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**iv.** **අංක PF - 7429 දරණ Cab රථය 2025.09.19 දින රඹුක්කනය මිලි මාවතේදී සිදු වූ අනතුරකට සම්බන්ධ අලුත් වැඩියාවන් සිදුකිරීමෙන් පසු අදාළ අලුත්වැඩියාවන් සිදුකළ සුසන්ත මෝටර්ස් වෙති රු.75,000.00 ක බිල් පතක් ඉදිරිපත් කර ඇත. (මෙම මුදලින් රු.52,706.25 ක මුදලක් පමණක් ප්‍රතිපූර්ණය කිරීමට රක්ෂණ සමාගම අනුමැතිය ලබා දී ඇති අතර මෙම අනතුර සම්බන්ධයෙන් මේ වන විට මූලික විමර්ශන ද ක්‍රියාත්මක වෙමින් පවතී.) එම බිල්පතට ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අතර එහිදී මෙම ගෙවීම් කටයුතු සඳහා මහසභා තීරණයක් බවට තීරණය වූ බැවින් එම තීරණය ගරු**

**සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අනතුරෙහි මුල් වටිනාකමට රක්ෂනාවරණය ලබා නොදීම සම්බන්ධව රක්ෂණ සමාගමෙන් විමසූ බවත්, ඊට පිළිතුරු ලෙස රියදුරු අපරිස්සාකාරී ලෙස (හැන්ඩ් බ්‍රේක් ඇද නොතිබීම) රිය නැවතීම හේතුවෙන් 25% ක් කපා ඇති බව දන්වා ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

රියදුරු මහතා තම වගකීම නිසි ලෙස ඉටු කළ යුතු බැවින් එතුමාගෙන් අදාළ අලාභය අයකර ගත යුතු බවත්, සභා අරමුදල් එවැනි අපරිස්සාකාරී වගකීම් විරහිතතා සඳහා යෙදවීම සුදුසු නොවන බවත්, මේ වන විටත් මේ සම්බන්ධ විමර්ශන කටයුතු සිදුවීමෙන් පවතින බැවින් මුදල ගෙවීම සම්බන්ධව ගැටළුවක් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විනය පරීක්ෂණය තවම ක්‍රියාත්මක වෙමින් පවතින බවත්, එහි පරීක්ෂණ වාර්තාව අනුව ගත යුතු ක්‍රියාමාර්ග එවිට ගන්නා බවත්, මේ අවස්ථාවේදී අදාළ ආයතනයට ගෙවීම් කිරීමට ඇති බැවින් සභා අරමුදලින් එම ප්‍රමාණය ලබාදී රියදුරු මහතාගේ වැටුපෙන් එය අය කිරීමට කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මෙම කැබ් රථය පදවන පුද්ගලයාගේ පත්වීම රියැදුරු තනතුරක් ද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රියදුරුකු ලෙස බඳවාගෙන ඇති බවත්, NVQ සහතිකය ලබා ගෙන ඇති බවත්, ගමනාගමන මණ්ඩලයෙහි (ඩිපෝව) පුහුණුව ලබා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

රජයේ නිල රථ පරිහරණය කිරීමේදී පළපුරුද්ද ඇති රියදුරු මහතකු ඒ සඳහා යෙදවිය යුතු බවත්, මහජන දේපළක් හානි වී ඇති බවත්, අනවශ්‍ය ලෙස සභා අරමුදල් වියදම් කළ නොහැකි බවත්, වගකීම් භාරදෙන විට වගකීම් දැරීමට සුදුසු පුද්ගලයකුට එය ලබාදිය යුතු බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාවෙහි පවතින්නේ පරීක්ෂණයට අදාළ තොරතුරු විමසීම නොවන බවත්, වාහනය අලුත් වැඩියා කිරීමට අදාළව වාහන අලුත්වැඩියාව සිදු කළ සුසන්ත මෝටර්ස් වෙත ගෙවිය යුතු මුදල ගෙවීම සම්බන්ධ බව ප්‍රකාශ කරන ලදී.

අනතුරු සම්බන්ධව රක්ෂණ සමාගම රු.75,000.00 ලෙස හානිය තක්සේරු කර ඇති බවත්, රක්ෂණ සමාගම සිදුකළ පරීක්ෂණයට ප්‍රතිඵලයක් ලෙස 25% ක අධිභාරයක් අයකර රු.52,706.25 ක මුදලක් සභාවට ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එසේම රක්ෂණ සමාගමෙන් මෙසේ අධිභාරයක් අය කිරීම සම්බන්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා**

බිල්පතේ වටිනාකමත් රක්ෂණ සමාගම ප්‍රතිපූර්ණය කර ඇති වටිනාකමත් අතර වෙනස සහා අරමුදලින් දරා පසුව රියදුරු මහතාගෙන් අය කිරිමට කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

රියදුරා රියදුරාගේ වගකීම හඳුනාගත යුතු බවත්, වාහනයෙහි රිය අසුනෙහි රියදුරු සිටිය යුතු බවත්, ඔහුගේ නොසැලකිල්ල මත මෙම අනතුර සිදුවී ඇති බවත්, ඒ හේතුවෙන් රක්ෂණ මුදල සම්පූර්ණයෙන් නොලැබී ඇති බැවින් ඔහුගෙන් අලාභයේ ඉතිරි මුදල ලබාගත යුතු බවත්, රියදුරු සම්බන්ධව, අනතුර සම්බන්ධව විනය පරික්ෂණයක් පවතින බැවින් ඉන් රියදුරු වැරදිකරු නම් ඔහුට ඊට දඬුවම් හිමිවන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. තවද, රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කරන ලද මුදල අදාළ අලුත්වැඩියාව සිදු කළ ගරාජය වෙත ලබාදීම සම්බන්ධ විරුද්ධත්වයක් නොමැති බවත් ඉතිරි මුදල රියදුරුගෙන් අයකර ගැනීමට කටයුතු සිදු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

අනතුරට සම්බන්ධ හානියේ වටිනාකමත් රක්ෂණ සමාගම ප්‍රතිපූර්ණය කරන ලද මුදලත් අතර පවතින වෙනස සභා අරමුදලින් ගෙවීම් කිරීමට අනුමැතිය ලබාදීම සම්බන්ධව ඉදිරිපත් වූ අදහස් අනුව රියදුරු මහතා වැරදිකරු බව පැහැදිලි වන බැවින් රියදුරු මහතාගෙන් එම මුදල අයකර ගැනීමේ පදනම මත ඉතිරි මුදල සභා අරමුදලින් ගෙවීමට එකඟතාවය ලබාදිය හැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මුදල් කමිටුවේදී මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, එහිදී මහසභා අනුමැතිය ලබා ගත යුතු බව යෝජනා වූ බැවින් මහසභාවට ඉදිරිපත් කළ බවත්, මෙම යෝජනාව සම්බන්ධව බෙදීම අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

අංක PF – 7429 දරණ Cab රථය 2025.09.19 දින රඹුක්කන මිලී මාවතේ දී සිදු වූ අනතුරට සම්බන්ධ අලුත්වැඩියාවන් සිදු කිරිම වෙනුවෙන් සුසන්ත මෝටර්ස් වෙතින් රු.75,000.00 ක බිල්පත් ඉදිරිපත් කර ඇති අතර මේ වන විට ක්‍රියාත්මක විමර්ෂණයෙහි තීරණයට යටත්ව අදාළ බිල්පතට ගෙවීමට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

v. **කොට්ඨාස අංක 01 හුරීමළුව දකුණු පාරෙහි පවතින 44/8 ඇල දේපළ සම්බන්ධවයි. ඇමුණුමෙහි සඳහන් ආකාරයට මෙම දේපළ සඳහා 2026.06.31 වන විට ලේඛනවල රු.15,829.32 ක හිඟ මුදලක් පවතී. නමුත් අයකර ගතයුතු නිවැරදි මුදල වන්නේ 2023.05.19 සිට 2026.06.31 දක්වා කාර්තුවකට රු.22.50 ගානේ කාර්තු 13 කට රු.292.50 වේ. ඒ අනුව වැඩිපුර ගණනය කර ඇති රු.15,536.82 ක මුදල කපා හැරීමට මහසභා අනුමැතිය ලබා ගැනීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රුමේෂා නමැති මෙම ඉඩම හිමිකාරිය එය නිවැරදි කරන ලෙසත්, වරිපනම් ගාස්තුව වැඩි බවට වරින් වර ඉල්ලීම් කර තිබෙන බවත්, මෙවර(2026) දේපළ තක්සේරු කිරීමේදී මෙම ලේඛනගත දෝෂය හමු වූ බවත්, ඒ අනුව එය නිවැරදි කර ගත යුතු බැවින් වැඩිපුර ගණනය කළ මුදල කපා හැරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
රු.15,000.00 ගණනක් සභා අරමුදලින් නිදහස් කිරීම ගැටළු සහගත විය හැකි බවත්, මෙම වැරැද්ද සිදුවූයේ කාගෙන්ද කවදාද යන්න පිළිබඳව සොයා බැලිය යුතු බවත්, මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා තීරණයක් ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙවර (2026) නව තක්සේරුව මේ වන විට ක්‍රියාත්මකව පවතින බවත්, එහිදී ලේඛනයේ සඳහන් පරිදි අදාළ දේපළ පරීක්ෂා කිරීමේදී එක් ඉඩමක නිවසක් ඉදිකර ඇති බවත්, අනෙක හිස් ඉඩමක් බව තහවුරු කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
මෙම ඉඩම් / දේපළ දෙක පෞද්ගලික දේපළක් ද සභා දේපළක් ද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
පෞද්ගලික දේපළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
පරීක්ෂණයක් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා , මේ සම්බන්ධව පරීක්ෂණයක් කිරීම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමන් යෝජනා කරන බැවින් ඒ සඳහා ඉදිරිපත් වන ලෙස ඉල්ලීම් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහමඩු සුක්රි මැතිතුමා**
තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදුකර වාර්තාවක් ලබා දී ඇති බැවින් අප විසින් නැවත එය පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
විෂය නිලධාරී විසින් ලේඛන සකස් කිරීමේදී අතපසුවීමක් සිදුවී ඇති බැවින් එය නිවැරදි කිරීමට අවශ්‍ය බව ප්‍රකාශ කළ අතර තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා විෂය නිලධාරීන් විශ්වාස නොකර සභා කටයුතු සිදු කරන්නේ කෙසේද යන්න විමසන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
ප්‍රාදේශය සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීන් හා තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරී හැල්ලුවට ලක්වීමක් සිදුවන බැවින් බෙදීමකට හෝ පරීක්ෂණයකට යාම සුදුසු නොවන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොමඩ් අනීස් මැතිතුමා**
මහසභාවේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසක් පවතින බැවින් ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී. තෙන්නකෝන් මැතිතුමා, එතුමාගේ අදහස ප්‍රකාශ කළ බවත්, මහසභාවේ මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් එතුමාට යම් සැකයක් මේ සම්බන්ධව තිබෙනවා විය හැකි බැවින් පරීක්ෂණයක් කිරීම සුදුසු බවට යෝජනා කළ විය හැකි බැවින් අදාළ ස්ථානය පරීක්ෂා කරබලා වාර්තාවක් ලබාදීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සැකය යන වචනය ඉල්ලා අස්කර කරගත යුතු බවත්, රඹුක්කන බල ප්‍රදේශයේ තීන්දු තීරණ ගන්නා උත්තරීතර මණ්ඩලය (විධායක) ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය බවත්, නිලධාරීන් විසින් අපට සහය දක්වන බැවින් එතුමන්ලාගේ සේවාව සැකකිරීම උචිත නොවන බවත් ප්‍රකාශ කරන ලදී. විපක්ෂ මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව නිවැරදිතාව පරීක්ෂා කර බැලීමේ අවශ්‍යතාවයක් පවතින බැවින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී. තෙන්නකෝන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පරීක්ෂණ මණ්ඩලයක් පත්කළ අතර එහි සාමාජිකයින් ලෙස,

01. ප්‍රාදේශීය සභා උපසභාපති - ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
02. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
03. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා

යන මන්ත්‍රීතුමන්ලා පත් කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

කොට්ඨාස අංක 01 හුරීමළුව දකුණු පාරෙහි පවතින 44/8 දේපළ සම්බන්ධවයි. ඇමුණුමෙහි සඳහන් ආකාරයට මෙම දේපළ සඳහා 2026.06.31 වන විට ලේඛනවල රු.15,829.32 ක හිඟ මුදලක් පවතී. නමුත් අයකර ගතයුතු නිවැරදි මුදල වන්නේ 2023.05.19 සිට 2026.06.31 දක්වා කාර්තුවකට රු.22.50 ගානේ කාර්තු 13 කට රු.292.50 වේ. ඒ අනුව වැඩිපුර ගණනය කර ඇති රු.15,536.82 ක මුදල කපා හැරීම වූ යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප වූ අතර මෙහි නිවැරදිතාව පරික්ෂා කර දැන ගැනීමට අවශ්‍ය බව සභාවෙන් යෝජනා වූ බැවින් ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරන ලදී.

කමිටු සාමාජිකයින්,

01. ප්‍රාදේශීය සභා උපසභාපති - ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
02. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
03. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා

**vi. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කිරීමෙන් පසුව එයින් 2025.12.31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රමාණ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව සඳහන් කර ලබාදී ඇති තත්ත්වා ගණනය කළ මතය මහසභාව වෙත දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රඹුක්කන ප්‍රාදේශීය සභාවේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කිරීමෙන් පසුව එයින් 2025.12.31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රමාණ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව සඳහන් කර ලබාදී ඇති තත්ත්වා ගණනය කළ මතය මහසභාව වෙත දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**vii.** **රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණයේ විදුලි සෝපානය සැපයීම, සවිකිරීම ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම කර්මාන්තයේ කාලය දීර්ඝ කිරීම සඳහා ඉල්ලීම් කර ඇත. ඒ අනුව 2026.07.13 දින දක්වා කාලය දීර්ඝ කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

කල් දී නොමැති යෝජනා අංක 05 මේ සමගම සාකච්ඡා කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පළාත් ඉංජිනේරු ආයතනය වෙත උපදේශන සේවාව සැපයීම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවූ බවත්, S.T.S ආයතනය වෙත ටෙන්ඩර් ප්‍රධානය වූ බවත්, ඔවුන්ගේ අධීක්ෂණ යටතේ වැඩ කටයුතු සිදු කරගෙන ගොස් තිබූ බවත්, වසර 2 ½ ක කාලයක් ඇතුළත අදාළ ව්‍යාපෘතිය අවසන් කර භාරදිය යුතුව තිබුණ ක්ෂේත්‍ර අධීක්ෂණයේදී වැඩ ගොඩක් ඉතිරිවී තිබූ බව හඳුනාගත් බවත්, සභාපති ලෙස තමා මැදිහත් වී ටෙන්ඩර්කරු, ප්‍රධාන ඉංජිනේරු හා උපදේශන සේවා ආයතනය සම්බන්ධීකරණය කළ බවත්, ඒ අනුව හැකි ඉක්මනින් ව්‍යාපෘතිය භාර දෙන ලෙස දැන්වූ බව ප්‍රකාශ කරන ලදී.

තවද, විදුලි සෝපානය සවිකිරීමට අවශ්‍ය ස්ථානය නිසි ලෙස S.T.S ආයතනය විසින් ඉදිකර අවසන් විය යුතු වුවද මේ වනතෙක් එම ඉදිකිරීම නිම කරලීමට ඔවුන් අපොහොසත් වී ඇති බවත්, එයට ප්‍රධානතම හේතුව සැලසුම් ප්‍රධාන ඉංජිනේරු ආයතනය විසින් ලබා දී නොතිබීම බවත්, එය මේ වන විට විසඳා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

සභාපතිතුමන් පැවසූ පරිදි අදාළ උපදේශන සේවාව ලබා ගැනීමේ ගැටළුව මත අදාළ කර්මාන්තය කරගෙන යාමේදී ගැටළු මතුවී ඇති බව ප්‍රකාශ වූ බවත්, නමුත් උපදේශන සේවාවන් සඳහා මුදල් වෙන් කිරීමක් කර ඇති බැවින් නිසි ලෙස උපදේශන සේවාව ලබා නොදීම සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගෙන තිබීමද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සාමාන්‍ය ක්‍රමවේදය බවත්, එසේ නොකර කොන්ත්‍රාකරුගෙන් හා උපදේශන සේවා ආයතනයෙන් අලාභය අය කර ගැනීම සිදු කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම මත නැවත මුදල් ලබාදීමක් සිදු නොවන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

ප්‍රධාන කොන්ත්‍රාත්කරු මාස 06 න් දින දීර්ඝ කිරීමක් ඉල්ලා සිටින විට උපකොන්ත්‍රාත්කරුවන සෝපාව සවිකිරීමේ කොන්ත්‍රාත්කරුට ඉතිරි වී ඇති කාලය මාසයක් වැනි කෙටි කාලයක් බැවින් ඔවුන්ටද දින දීර්ඝයක් අවශ්‍ය විය හැකි බව ප්‍රකාශ කරන ලදී. තවද , මාස 06 වැනි කාලයක් ලබාදීම මත ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් කර්මාන්තය නිම කිරීමට කටයුතු කළ හැකි බවත්, එම නිසා මාස 03 ක් වැනි කාලයකට දින දීර්ඝ කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

උපසභාපතිතුමන්ගේ අදහසට තමා එකඟ බවත්, වැඩ බිමේදී ඔවුන් සමඟ පැවති සාකච්ඡාවේදී තමා දිගින් දිගටම ප්‍රකාශ කර සිටියේ මාස 03 ක් ලබාදිය හැකි බවත්, නමුත් හැකි ඉක්මනින්ම විදුලි සෝපානය සවි කිරීමට අදාළ සිවිල් වැඩ නිම කළ යුතුය යන්න තමා ඔවුන්ට දැන් වූ බවත් ප්‍රකාශ කරන ලදී. මාස 06 ක් අනුමත කළද මාස 03 ක් ලබා දෙන බවත්, එම කාලය තුළ ඔවුන්ගේ සේවාවේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කර නැවත දින

දීර්ඝයක් ඉල්ලුව හොත් ලබාදීමට මෙසේ මාස 06 ක කාලය අනුමත කිරීමට යෝජනා කළ බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණයේ විදුලි සෝපානය සැපයීම, සවිකිරීම ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම කර්මාන්තයේ කාලය දීර්ඝ කිරීම සඳහා ඉල්ලීම් කර ඇත . මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණයේ විදුලි සෝපානය සැපයීම, සවිකිරීම ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම කර්මාන්තයේ කාලය දීර්ඝ කිරීම සඳහා ඉල්ලීම් කර ඇත. ඒ අනුව 2026.07.13 දින දක්වා කාලය දීර්ඝ කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීමට වු යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**viii. නො.අංක 04, මිහිඳු මාවත වරිපනම් අංක 4/1/K දේපළ (ඇස්බැස්ටස් සෙවිලි ප්‍රජාශාලාව) එන්.එච්.කීර්තිරත්න නමින් බිල්වන අතර එම දේපළ සභා දේපළක් බැවින් බිල්කිරීම නතර කරන ලෙස ආදායම් පරිපාලක වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත. II කාර්තුවේ සිට බිල්කිරීම නතර කිරීම සිදු වුවත් මේ වන විට රු.8,380.77 ක බිල්වීමක් ඇත. එම මුදල කපා හැරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය පිටුපස ග්‍රාමසේවක කාර්යාලය පවතින ගොඩනැගිල්ල මෙය වන බවත්, නීත්‍යානුකූල වශයෙන් එම දේපළ සභාව සතු බවත් ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

නො.අංක 04, මිහිඳු මාවත වරිපනම් අංක 4/1/K දේපළ (ඇස්බැස්ටස් සෙවිලි ප්‍රජාශාලාව) එන්.එච්.කීර්තිරත්න නමින් බිල්වන අතර එම දේපළ සභා දේපළක් බැවින් බිල්කිරීම නතර කරන ලෙස ආදායම් පරිපාලක වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත. II කාර්තුවේ සිට බිල්කිරීම නතර කිරීම සිදු වුවත් මේ වන විට රු.8,380.77 ක බිල්වීමක් ඇත. එම මුදල කපා හැරීම සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීමට වු යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ix. කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය යොදවා ඇති පහත නම් සඳහන් සේවකයින් තිදෙනාගේ ගිවිසුම් කාලය ඔවුන්ගේ නමට ඉදිරියෙන් ඇති දිනවල සිට සේවා අවශ්‍යතාවය මත නැවත ඉදිරියට මාස 03 ක කාලයකින් දීර්ඝ කර ගැනීමටත්, එම කාලය සඳහා ඔවුන් වෙත දෛනිකව රු.1,500.00 ක දීමනාවක් ගෙවීම් කිරීමටත් සහා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

- එච්.එන්.පී.හෙට්ටිආරච්චි මයා **- 2026.07.03 සිට 2026.10.02 දක්වා**
- ඒ.ඩී.ගුණරත්න මයා **- 2026.08.02 සිට 2026.11.01 දක්වා**
- ආර්.ඩී.එස් ප්‍රදීප් කුමාර මයා **- 2026.08.02 සිට 2026.11.01 දක්වා**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය යොදවා ඇති පහත නම් සඳහන් සේවකයින් තිදෙනාගේ ගිවිසුම් කාලය ඔවුන්ගේ නමට ඉදිරියෙන් ඇති දිනවල සිට සේවා අවශ්‍යතාවය මත නැවත ඉදිරියට මාස 03 ක කාලයකින් දීර්ඝ කර ගැනීමටත්, එම කාලය සඳහා ඔවුන් වෙත දෛනිකව රු.1,500.00 ක දීමනාවක් ගෙවීම් කිරීමටත් මහසභා අනුමැතියට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- එච්.එන්.පී.හෙට්ටිආරච්චි මයා - 2026.07.03 සිට 2026.10.02 දක්වා
- ඒ.ඩී.ගුණරත්න මයා - 2026.08.02 සිට 2026.11.01 දක්වා
- ආර්.ඩී.එස් ප්‍රදීප් කුමාර මයා - 2026.08.02 සිට 2026.11.01 දක්වා

x. **කොට්ඨාශ අංක 08 නුවර පාර වම වරිපනම් බදු අය කරනු ලැබූ දේපළ 02 ක් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් කඩා ඉවත් කිරීම නිසා එම දේපළ තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම හා හිඟ මුදල් වන රු.3,850.59 කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාර්ග රක්ෂිතයේ පදිංචිව සිට පුද්ගලයින් බවත් ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

කොට්ඨාශ අංක 08 නුවර පාර වම වරිපනම් බදු අය කරනු ලැබූ දේපළ 02 ක් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් කඩා ඉවත් කිරීම නිසා එම දේපළ තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම හා හිඟ මුදල් වන රු.3,850.59 කපා හැරීම සඳහා වන යෝජනාව ඒකමතිතව ප්‍රතික්ෂේප විය.

xi. **කොට්ඨාශ අංක 08 නුවර පාර දකුණ හා කොට්ඨාශ අංක 09 රඹුක්කන පාර වම වරිපනම් ප්‍රදේශවල දිට්වා සුළිකුණාටුව හේතුවෙන් නාය යෑමට ලක් වූ ඇමුණුමෙහි සඳහන් දේපළවල වරිපනම් බදු බිල්පිම නතර කිරීම හා හිඟ මුදල් වන රු.13,979.92 කපා හැරීමට සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

2025 දෙසැම්බර් මාසයේ අගදී දිට්වා පැමිණි බවත්, එතෙක් පැවැති හිඟ මුදල් අය කර ගත යුතු බවත්, 2026 වර්ෂයේ හිඟ මුදල කපා හැරීමට අනුමැතිය ලබාදීම ඇය ගැටළුවක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

අදාළ පරීක්ෂක ලවා අදාළ දේපළ සම්බන්ධ නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන තෙක් තීරණයක් නොගෙන සිටීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ආදායම් පරීක්ෂක නිලධාරීන්ගෙන් ලබාගත යුතු තොරතුරු මොනවාදැයි විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

අදාළ ලිපිනය පිළිබඳ තොරතුරු ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නිලධාරීන් ලබා දෙන තොරතුරු මත පදනම්ව තීන්දු තීරණ ගන්නා බවත්, ඔවුන්ව සැමවිට අධීක්ෂණය කිරීම සුදුසු නොවන බවත්, ඔවුන් ලබා දෙන තොරතුරු මත පදනම්ව තීරණය ගත නොහැකි නම් මන්ත්‍රී භූමිකාවෙන් බැස නිලධාරි භූමිකාව රඟපාන ලෙස ප්‍රකාශ කරන ලදී. යෝජනාවේ පැහැදිලිව හිඟ මුදල වෙන්කර දක්වා නොමැති බැවින් එය සටහන් කර නැවත ඉදිරිපත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

කොට්ඨාශ අංක 08 නුවර පාර දකුණ හා කොට්ඨාශ අංක 09 රඹුක්කන පාර වම වරිපනම් ප්‍රදේශවල දිට්වා සුළිකුණාටුව හේතුවෙන් නාය යෑමට ලක් වූ ඇමුණුමෙහි සඳහන් දේපළවල වරිපනම් බදු බිල්වීම නතර කිරීම හා හිඟ මුදල් වන රු.13,979.92 කපා හැරීම සඳහා වන යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප විය.

**xii. රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිය අ.පො.ස (උ.පෙළ) විභාගය සමත්ව විශ්ව විද්‍යාල ප්‍රවේශය හිමිකර ගත්, එහෙත් අඩු ආදායම්ලාභී පවුල්වල සුදුසුකම් ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පස්දෙනෙකු (05) වෙනුවෙන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු දිරිගැන්වීම සඳහා එක් අයෙකුට රු.10,000.00 බැගින් රු.50,000.00 ක ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙවර උසස් පෙළ ඕනෑම විෂය ධාරාවකින් විභාගයට පෙනී සිටින, දිස්ත්‍රික් කුසලතාවය පදනම් කරගෙන ඒ අතුරින් අඩු ආදායම්ලාභී පවුල්වල ශිෂ්‍යයන් තෝරාගෙන මන්ත්‍රී මණ්ඩලයෙන් සැදුම්ලත් කමිටුවක් පත් කරගෙන සුදුස්සන් තෝරා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ප්‍රතිපාදන වෙන් කර ගැනීම සම්බන්ධව ආණ්ඩුකාර අනුමැතිය ලබා ගත යුතු බැවින් පුද්ගලයින් හඳුනා ගැනීමක් අවශ්‍ය නොවන්නේද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අයවැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන්වී තිබෙන බවත්, දෙසැම්බර් අගදී විභාග ප්‍රතිඵල මත වියදම් දැරීමට ගෙවිය යුතු මුදල ණය හිමි ලෙස වෙන් කර ගැනීමට නම් මෙම යෝජනාව අනුමත වී තිබිය යුතු බව පැහැදිලි කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිය මෙවර (2026 වර්ෂයේ) අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිට විශ්ව විද්‍යාල ප්‍රවේශය හිමිකර ගන්නා, එහෙත් අඩු ආදායම්ලාභී පවුල්වල සුදුසුකම් ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පස්දෙනෙකු (05) වෙනුවෙන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු දිරිගැන්වීම සඳහා එක් අයෙකුට රු.10,000.00 බැගින් රු.50,000.00 ක ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනිමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xiii. ජාතික සාහිත්‍ය හා කියවීමේ මාසය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් මාලාවට අදාළව සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව හා ඒ සඳහා වියදම් ඇස්තමේන්තු ගත මුදල් ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර**

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

ජාතික සාහිත්‍ය හා කියවීමේ මාසය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් මාලාවට අදාළව සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව හා ඒ සඳහා වියදම් ඇස්තමේන්තු ගත මුදල් ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනිමට වු යෝජනාව ඒකමතිතව සභා සම්මත විය.(වියදම් ඇස්තමේන්තුගත වටිනාකම රු 296,000.00)

**xiv. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (3) විධිවිධානයට යටත් පහත උපලේඛනයේ සඳහන් දේපළවල හිමිකම පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බවට තහවුරු කර ඇති බැවින් එකී දේපළ වර්තමාන හිමිකාරීත්වය වෙත සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාවට සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

උප ලේඛනය

| අනු අංකය | දේපළ | පැරණි හිමිකාරීත්වය | සංශෝධනය විය යුතු බවට යෝජනා කරන වර්තමාන හිමිකාරීත්වයේ | තහවුරු කරන ලේඛන |
|---|---|---|---|---|
| 01 | මොරගොල්ල වත්ත (වඩුවාදෙණිය වසම) | ආර්.එම්.ඉන්ද්‍රාණි ජයතිලක | එච්.එම්.එස්.එම්. දේදුනුපිටිය | මෙම දේපළ එච්.එම්.එස්.එම්. දේදුනුපිටිය මයා වෙත හිමි වී ඇති බවට 1380, 1201, 1168 දරණ ඔප්පු පිටපත් හා 3676, 3677 දරණ පිඹුරු පිටපත් |
| 02 | පුවක්ගහමුල හේන (නාරම්බැද්ද බටහිර වසම) | එස්. කරුණාරත්න | ඩබ්.ඩී.සුසන්ත ජයවීර | මෙම දේපළ ඩබ්.ඩී.සුසන්ත ජයවීර යන අයට හිමිව ඇති බවට15663 දරණ ඔප්පු පිටපත හා අංක 499 දරණ පිඹුරු පිටපත |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (3) විධිවිධානයට යටත් පහත උපලේඛනයේ සඳහන් දේපළවල හිමිකම පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බවට තහවුරු කර ඇති බැවින් එකී දේපළ වර්තමාන හිමිකාරීත්වය වෙත සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

උපලේඛනය

| අනු අංකය | දේපළ | පැරණි හිමිකාරීත්වය | සංශෝධනය විය යුතු බවට යෝජනා | තහවුරු කරන ලේඛන |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| | | | කරන වර්තමාන හිමිකාරීත්වයේ | |
| 01 | මොරගොල්ල වත්ත (වඩුවාදෙණිය වසම) | ආර්.එම්.ඉන්ද්‍රාණි ජයතිලක | එච්.එම්.එස්.එම්. දේදුනුපිටිය | මෙම දේපළ එච්.එම්.එස්.එම්. දේදුනුපිටිය මයා වෙත හිමි වී ඇති බවට 1380, 1201, 1168 දරණ ඔප්පු පිටපත් හා 3676, 3677 දරණ පිඹුරු පිටපත් |
| 02 | පුවක්ගහමුල හේන (නාරම්බැද්ද බටහිර වසම) | එස්. කරුණාරත්න | ඩබ්.ඩී.සුසන්ත ජයවීර | මෙම දේපළ ඩබ්.ඩී.සුසන්ත ජයවීර යන අයට හිමිව ඇති බවට15663 දරණ ඔප්පු පිටපත හා අංක 499 දරණ පිඹුරු පිටපත |

**xv.** **කිසියම් දේපලක් මත අක්කර බද්දක් පැනවීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(3) විධි විධානයට අනුව උපරිම සීමාව හෙක්ටයාර් 01 ප්‍රමාණය ඉක්මවිය යුතු වේ. එහෙත් මෙහි පහත උප ලේඛනයේ සඳහන් දේපළ ව්‍යවස්ථාපිත නීතියෙන් අනුමත කර ඇති උපරිම සීමාව එකී උපලේඛනයේ ඒ ඒ දේපල වලට අදාළව විස්තර කර ඇති පරිදි ඉක්මවීමක් සිදුකර නොමැති බැවින් එම දේපළ අක්කර බදු ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා වූ යෝජනාවට සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

උප ලේඛනය

| අනු අංකය | ඉඩම නම | පනතේ 134(3) අදාළ නොවීමට හේතුව |
|---|---|---|
| **01.** | **බෝගහතැන්න හෙවත් උඩහවත්ත (තල්දැව වසම)** | **කැබිලි වීම (අංක 26211 දරණ ඔප්පු පිටපත හා අංක 668 දරණ පිඹුරු පිටපත ඉදිරිපත් කර ඇත.)** |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

කිසියම් දේපලක් මත අක්කර බද්දක් පැනවීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(3) විධි විධානයට අනුව උපරිම සීමාව හෙක්ටයාර් 01 ප්‍රමාණය ඉක්මවිය යුතු වේ. එහෙත් මෙහි පහත උප ලේඛනයේ සඳහන් දේපළ ව්‍යවස්ථාපිත නීතියෙන් අනුමත කර ඇති උපරිම සීමාව එකී උපලේඛනයේ ඒ ඒ දේපල වලට අදාළව විස්තර කර ඇති පරිදි ඉක්මවීමක් සිදුකර නොමැති බැවින් එම දේපළ අක්කර බදු ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා මහසභා අනුමැතියට ඉදිරිපත් වූ යෝජනාවට ඒකමතිකව සභා සම්මත විය.

උප ලේඛනය

| අනු අංකය | ඉඩම නම | පනතේ 134(3) අදාළ නොවීමට හේතුව |
|---|---|---|
| 01. | බෝගහතැන්න හෙවත් උඩහවත්ත (තල්දැව වසම) | කැබිලි වීම (අංක 26211 දරණ ඔප්පු පිටපත හා අංක 668 දරණ පිඹුරු පිටපත ඉදිරිපත් කර ඇත.) |

**xvi.** **ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිනිය 2026.06.01 දින සිට ස්ථාන මාරු වීම හේතුවෙන් චෙක්පත් හා අණකර වලට අත්සන් කිරීම සඳහා 2026.06.01 දින සිට පත් වූ නව ප්‍රධාන කළමනාකරණ සේවා**

**නිලධාරී ඩබ්.වී.ඩී.කරුණාරත්න මියගේ අත්සන හා කළමනාකරණ සේවා නිලධාරී ඩබ්.ඒ.එන්.කේ.වර්ණසූරිය මියගේ අත්සන දෙවන අත්සන ලෙස යොදා ගැනීමට මහ සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිනිය 2026.06.01 දින සිට ස්ථාන මාරු වීම හේතුවෙන් වෙක්පත් හා අණකර වලට අත්සන් කිරීම සඳහා 2026.06.01 දින සිට පත් වූ නව ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි ඩබ්.වී.ඩී.කරුණාරත්න මියගේ අත්සන හා කළමනාකරණ සේවා නිලධාරී ඩබ්.ඒ.එන්.කේ.වර්ණසූරිය මියගේ අත්සන දෙවන අත්සන ලෙස යොදා ගැනීමට මහ සභා අනුමැතියට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xvii.** **දිට්වා ආපදා තත්ත්වය හේතුවෙන් හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යාපෘති 17 ක් ඉටුකිරීමට අප සභාව වෙත ලැබී ඇත. එහිදී එම ව්‍යාපෘති සුදුසු කොන්ත්‍රාත්කරුවකුට පිරිනැමීමේදී ප්‍රසම්පාදන කමිටු තීරණය මහසභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වීම සිදුකළ යුතුය.නමුත් මෙම ව්‍යාපෘතිය කඩනමින් ඉටු කළ යුතු බවට උපදෙස් ලැබී ඇති බැවින් ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා මහසභාවට තීරණය ඉදිරිපත් කිරීමට යම් වැඩි දින ගණනක් පවතින විට පමණක් හා දිට්යා ව්‍යාපෘතිය සඳහා පමණක් කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහමම්දු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මිලයන 17 ක් වෙන් වී ඇති බවත්, ඉතා ඉක්මනින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බැවින් මෙම යෝජනාව සිදුකළ බවත් ප්‍රකාශ කරන ලදී. තවද, ප්‍රජා මූල සංවිධාන වලට මිලියන 02ක ප්‍රමාණයක් පළාත් පාලන අමාත්‍යාංශය මගින් වෙන් කර තිබුණද මෙම දිට්වා හේතුවෙන් මිලියන 05 ක් දක්වා කොන්ත්‍රාත් පිරිනැමීමේ හැකියාව පවතින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ස්වේච්ඡා සංවිධාන වල මිලියන 05 දක්වා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ හැකියාව පැවතුණද හැකියා සහතිකය ලබා ගැනීමට යාමේදී ප්‍රජා මූල සංවිධානයේ පවතින වත්කම් ප්‍රමාණය නිරීක්ෂණය කරන බවත්, එවැනි විශාල ව්‍යාපෘති සිදුකිරීමට බොහෝ ප්‍රජාමූල සංවිධාන වලට වත්කම් නොමැති වීම මත නොහැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතව පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාවය පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

දිට්වා ආපදා තත්ත්වය හේතුවෙන් හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යාපෘති 17 ක් ඉටුකිරීමට අප සභාව වෙත ලැබී ඇත. එහිදී එම ව්‍යාපෘති සුදුසු කොන්ත්‍රාත්කරුවකුට පිරිනැමීමේදී ප්‍රසම්පාදන කමිටු තීරණය මහසභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා කොන්ත්‍රාත්කරු සමහ ගිවිසුම්ගත වීම සිදුකළ යුතුය.නමුත් මෙම ව්‍යාපෘතිය කඩනමින් ඉටු කළ යුතු බවට උපදෙස් ලැබී ඇති බැවින් ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා මහසභාවට තීරණය ඉදිරිපත් කිරීමට යම් වැඩි දින ගණනක් පවතින විට පමණක් හා දිට්යා ව්‍යාපෘතිය සඳහා පමණක් කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xviii. 2026 පොදු අරමුදල් යටතේ කළුකොහුතැන්න ගම මැද පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතයට අදාළ රු 480,000.00 ක් වන ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතව පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාවය පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

2026 පොදු අරමුදල් යටතේ කළුකොහුතැන්න ගම මැද පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතයට අදාළ රු 480,000.00 ක ඇස්තමේන්තුව අනුමැතියට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xix. 2026 පොදු අරමුදල් යටතේ ගම්බල වත්තට යන උඩමුල්ල හරහා වැටී ඇති මාර්ගය සංවර්ධනය කිරීම අදියර I සඳහා වන රු645,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතව පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාවය පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

2026 පොදු අරමුදල් යටතේ ගම්බල වත්තට යන උඩමුල්ල හරහා වැටී ඇති මාර්ගය සංවර්ධනය කිරීම අදියර I සඳහා වන රු645,000.00 ක ඇස්තමේන්තුව අනුමැතියට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xx. 2026 සභා අරමුදල් යටතේ කළුකොහුතැන්න සමිති ශාලා පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය සඳහා වන රු325,000.00 ක ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතව පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාවය පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

2026 සභා අරමුදල් යටතේ කළුකොහුතැන්න සමිති ශාලා පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය සඳහා වන රු325,000.00 ක ඇස්තමේන්තුව අනුමැතියට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xxi. 2026 පොදු අරමුදල් යටතේ කිරිවන්දෙණිය ගල්ඔරුව මාර්ගයේ කැඩී ඇති ස්ථාන පිළිසකර කිරීම (මාර්ගය ආසන්නයේ ඇති පැති බැම්ම බැඳීම) සඳහා වන රු.265,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාවය පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

2026 පොදු අරමුදල් යටතේ කිරිවන්දෙණිය ගල්ඔරුව මාර්ගයේ කැඩී ඇති ස්ථාන පිළිසකර කිරීම (මාර්ගය ආසන්නයේ ඇති පැති බැම්ම බැඳීම) සඳහා වන රු.265,000.00 ක ඇස්තමේන්තුව අනුමැතියට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xxii. 2026 පොදු අරමුදල් යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභා සතිපොළෙහි වහලයේ පීල්ල සකස් කිරීම සඳහා වන රුපියල් මිලියන 1.3 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගුණු බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

2026 පොදු අරමුදල් යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභා සතිපොළෙහි වහලයේ පීල්ල සකස් කිරීම සඳහා වන රුපියල් මිලියන 1.3 ක් වටිනා ඇස්තමේන්තුව අනුමැතියට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xxiii. 2026.04.25 දින සිට 2026.05.31 දක්වා ගෙවීම් පිළිබඳ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2026.04.27 | 549 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | ජල බිල්පත් ගෙවීම | 7,087.86 |
| | 550 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | ජල බිල්පත් ගෙවීම | 1,368.80 |
| | 551 | the associated news paper of Ceylon Limited | සභා දේපල බදු දීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන දැන්වීම් පුවත්පත්වල පළ කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 89,680.00 |
| | 552 | මුදල් භාරකරු, | අංක 33 ගව මස් කඩ ප්‍රසම්පාදන ඇප තැන්පතු මාසික බදු කුලියට හිලව් කිරීම | 15,000.00 |
| | 553 | ලේඛා ස්ටේෂනරිස් | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය - පුවත්පත් සඟරා බිල්පත් ගෙවීම | 13,940.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 554 | ලේඛා ස්ටේෂනරිස් | රඹුක්කන පුස්තකාලය - පුවත්පත් සඟරා බිල්පත් ගෙවිම | 16,740.00 |
| | 555 | මුදල් භාරකරු | පරිසර ඇගයුම් කමිටු දිමනා ගෙවිම | 22,500.00 |
| 2026.04.28 | 556 | ඉලෙක්සිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා ප්‍රයිවට් ලිම්ඩට් | විදුලි බිල්පත් ගෙවිම | 69,013.05 |
| | 557 | ඉලෙක්සිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා ප්‍රයිවට් ලිම්ඩට් | විදුලි බිල්පත් ගෙවිම | 49,918.53 |
| | 558 | පාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය | ජල බිල්පත් ගෙවිම | 95,668.82 |
| | 559 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවිම | 17,600.00 |
| | 560 | ශ්‍රී ලංකා ටෙලිකොම් පිඑල්සී | දුරකථන බිල්පත් ගෙවිම | 13,545.83 |
| | 561 | සි/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඉන්ධන බිල්පත් ගෙවිම | 558,610.00 |
| | 562 | දොඹේමඩ නැගෙනහිර ගොවි සංවිධානය | ඉහලගම ප්‍රධාන මාර්ගයේ ගල්වැටිහේන වැරැල්ල දක්වා මාර්ගය සංවර්ධනය කිරිම 10% රැදවුම් මුදල් ගෙවිම | 16,618.64 |
| 2026.04.29 | 563 | මුදල් භාරකරු | සැලසුම් කමිටු දිමනා ගෙවිම | 36,000.00 |
| | 564 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | පැරණි වෙළඳ සංකිර්ණයේ ගිනි රක්ෂණාවරණය වෙනුවෙන් ගෙවිම | 19,759.37 |
| | 565 | H.G. උපාලි විජය වික්‍රම | විනෝද බදු ඉතිරි මුදල් ආපසු ගෙවිම | 5,550.00 |
| | 566 | මුදල් භාරකරු | 2026 පෙබරවාරි මස සභික දිමනා ගෙවිම | 15,000.00 |
| | 567 | මුදල් භාරකරු | 2026 මාර්තු මස සභික දිමනා ගෙවිම | 30,000.00 |
| | 568 | Kegqll distribution lanka (pvt)ltd | ආදාහනාගාරය සඳහා ලිට්රෝ ගෑස් 37.5 kg සිලින්ඩර 06 සැපයිම සඳහා ගෙවිම | 123,395.00 |
| 2026.04.30 | 569 | රංජනි බේක් හවුස් | කොම්පෝස්ට් අංගනයේ පොලිතින් පැටවු කම්කරු මහතුන් හට සංග්‍රහ වියදම් ගෙවිම | 720.00 |
| | 570 | රංජනි බේක් හවුස් | මහ සභාව සංග්‍රහ වියදම් ගෙවිම | 645.00 |
| 2026.05.04 | 571 | එස්.නන්දශ්‍රී | අතිකාල දීමනා ගෙවිම | 7,346.85 |
| | 572 | එල්.ආර්.ඒ.ඩී. කුමාරිහාමි | ගමන් වියදම් ගෙවිම | 4,900.00 |
| | 573 | එච්.ආර්.ඊ.එම්.ඩී. හෙට්ටිආරච්චි | ගමන් වියදම් ගෙවිම | 4,217.20 |
| 2026.05.05 | 574 | මුදල් භාරකරු | 2026 අප්‍රේල් මස සභික දිමනා ගෙවිම | 30,000.00 |
| | 575 | මුදල් භාරකරු | 2026 අප්‍රේල් මස සභික දිමනා ගෙවිම | 370,000.00 |
| | 576 | මුදල් භාරකරු | ලබා නොගත් ඇප තැන්පතු ආදායමට ගැනිම | 61,000.00 |
| | 577 | මුදල් භාරකරු | ගව මස් කඩ ප්‍රසම්පාදන ඇප බදු කුලියට හිලව් කීරිම | 15,000.00 |
| | 578 | එච්.සී.එන්.කරුණාතිලක | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවිම | 1,000.00 |
| 2026.05.06 | 579 | මුදල් භාරකරු | SG-7429 කැබ් රථය ආදායම් බලපත්‍ර ලබා ගැනිම සඳහා අත්තිකාරම් ලබා ගැනිම | 15,640.00 |
| | 580 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර වටිනාකම අලුත් කීරිම | 60,000.00 |
| | 581 | ගිරිවඩුන්න ටයර් සර්විස් ඇන්ඩ් හිරිවඩුන්න මෝටර්ස් | බැකෝ යන්ත්‍රය අලුත් වැඩියා සිදු කිරිම සඳහා ගෙවීම | 8,400.00 |
| | 582 | ඩබ්.ජී.කේ.ඩී.එම්. කුමාර | ජල නල ඇප තැන්පතු ආපසු ගෙවිම | 2,000.00 |
| | 583 | ආර්.ජී.එස්.නිරෝෂන් | නිවාඩු දින වැටුප් ගෙවීම | 13,712.00 |
| | 584 | එස්.ජේ.එස්.සමරසිංහ | ගමන් වියදම් ගෙවිම | 3,600.00 |
| | 585 | එච්.ආර්.ර්.එම්.ඩී. හෙට්ටිආරච්චි | ගමන් වියදම් ගෙවීම | 1,140.00 |
| | 586 | එච්.ආර්.වරුණි ප්‍රියංකා | ගමන් වියදම් ගෙවීම | 8,500.00 |
| | 587 | බී.අයි.ජී. ප්‍රේමසිරි | ගමන් වියදම් ගෙවීම | 6,300.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 588 | පි.ඩී.ඩබ්.චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 4,550.00 |
| | 589 | ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුටස් ලංකා (ප්‍රයිවට් ලිමිඩට්) | විදුලි බිල්පත් ගෙවීම | 1,149.20 |
| | 590 | ඊ.ඒ.ටී.කේ.එදිරිසිංහ | ගමන් වියදම් ගෙවීම | 5,005.20 |
| | 591 | SDS කන්ස්ට්‍රක්ෂන් | ශ්‍රවණාගාර සංකිර්ණය ඉදි කිරිම පස්වන බිල්පත ගෙවිම | 7,352,923.15 |
| 2026.05.08 | 592 | මුදල් භාරකරු | කම්කරු දෛනික වැටුප් ගෙවිම | 100,050.00 |
| | 593 | එස්.කේ.පර්සි රත්නපාල | ගලි සේවාව සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවිම | 9,875.00 |
| | 594 | ටී.එම්. එන්.එන්. තෙන්නකෝන් | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවිම | 773.82 |
| 2026.05.11 | 595 | බී.ඒ. අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවිම | 6,737.00 |
| | 596 | බී.අයි.ජී. ප්‍රේමසිරි | නිවාඩු දින වැටුප් ගෙවීම | 1,741.67 |
| | 597 | බී.අයි.ජී. ප්‍රේමසිරි | නිවාඩු දින වැටුප් ගෙවීම | 1,741.67 |
| | 598 | මුදල් භාරකරු | 2026 අප්‍රේල් මස සභික දිමනා ගෙවිම | 75,000.00 |
| | 599 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | SGRC 2027 ට්‍රැක්ටරය රක්ෂණාවරනය සිදු කිරිම | 11,937.80 |
| 2026.05.12 | 600 | ආර්.එම්.එස්.ඒ.රත්නායක | ගමන් වියදම් ගෙවීම | 4,016.85 |
| | 601 | ආර්.එම්.එස්.ඒ.රත්නායක | ගමන් වියදම් ගෙවීම | 2,718.91 |
| | 602 | ඩබ්.ඩබ්.විරක්කොඩි | ගමන් වියදම් ගෙවීම | 3,850.00 |
| | 603 | ඩබ්.ඩබ්.විරක්කොඩි | අතිකාල දීමනා ගෙවිම | 16,643.48 |
| | 604 | එච්.ඒ.සී.එල්.පියසේන | අතිකාල දීමනා ගෙවිම | 8,307.00 |
| | 605 | එච්.සී.කේ. හෙට්ටිගොඩ | අතිකාල දීමනා ගෙවිම | 17,185.49 |
| 2026.05.13 | 606 | එම්.ආර්.සී.යූ.බංඩාර | සභාව සතු වාහන වල අලුත් වැඩියා කටයුතු සිදු කිරිම සඳහා ඉංජිනේරු වාර්තා ලබා ගැනිම වෙනුවෙන් ගෙවිම | 14,000.00 |
| | 607 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | SGPR 7429 ඩබල් කැබ් රථයේ රක්ෂණාවරණය සිදු කිරිම | 115,101.31 |
| | 608 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | SGRW- 5799 වාහනය රක්ෂණය කිරිම | 3,314.03 |
| | 609 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. | දුරකථන බිල්පත් ගෙවිම | 9,806.48 |
| | 610 | ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුටස් ලංනා (ප්‍රයිවට් ලිමිඩට්) | විදුලි බිල්පත් ගෙවීම | 72,818.46 |
| | 611 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | ජල බිල්පත් ගෙවිම | 6,670.93 |
| | 612 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | ජල බිල්පත් ගෙවිම | 1,258.67 |
| | 613 | තිලක හාඩ්වෙයාර් | ට්‍රැක්ටර් ටේලරය අලුත් වැඩියා කිරිම සඳහා ZN/A/Sheet 01 මිළදී ගැනිම | 3,300.00 |
| | 614 | පි.පී.සිරිසේන | ඉදල් සැපයිම වෙනුවෙන් ගෙවිම | 9,800.00 |
| | 615 | ඒෂියන් හාර්වෙයාර් | ට්‍රැක්ටර් ටේලරය අලුත් වැඩියා කිරිම සඳහා ජෙන්ට් මිළදි ගැනීම | 16,580.00 |
| | 616 | ඒෂියන් හාර්වෙයාර් | ට්‍රැක්ටර් ටේලරය අලුත් වැඩියා කිරිම සඳහා අවශ්‍යා ද්‍රව්‍ය මිළදි ගැනීම | 2,250.00 |
| | 617 | සර්.ඇන්තනීස් ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවිම | 43,275.00 |
| | 618 | මහනුවර ට්‍රේඩර්ස් | ග්ලවුස් සැපයිම වෙනුවෙන් ගෙවිම | 48,425.00 |
| | 619 | ධර්මසිරි ටයර් හවුස් | බැකෝ යන්ත්‍රය සඳහා ටයර් 02 සැපයිම වෙනුවෙන් ගෙවිම | 144,975.00 |
| | 620 | සෙනොක් ට්‍රේඩ් කම්බයින් ප්‍රයිවට් ලිමිඩට් | බැකෝ යන්ත්‍රය අලුත් වැඩියා කටයුතු සිදු කිරිම සඳහා අවශ්‍යා ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවිම | 159,393.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 621 | එල් .එච්.චන්ද්‍රසේකර බ්‍රදර්ස් ප්‍රයිවට් ලිමිඩඩ් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 9,091.90 |
| | 622 | යූ.කේ. ඉලෙක්ට්‍රිකල්ස් | ස්ටෑන් ෆෑන් 01 මිළදී ගැනිම වෙනුවෙන් ගෙවීම | 8,164.13 |
| | 623 | ජේපර් ලයින් ඩේඩින් ප්‍රයිවට් ලිමිටඩ් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 39,989.40 |
| | 624 | ගුණරත්න සෙරමික් | ඉඹුල්ගස්දෙනිය සායන මධ්‍යස්ථාන වැසිකිලි පද්ධතිය අලුත් වැඩියා කිරීම සඳහා ද්‍රව්‍ය සැපයීම | 2,000.00 |
| | 625 | සූරමාා සෙරමික් | අශෝක ක්‍රීඩාංගනය සඳහා බෝල් වැල් 01 සැපයිම වෙනුවෙන් ගෙවීම | 3,350.00 |
| | 626 | KEGALLE DISTRIBUTORS (PVT)LTD | ලිට්රෝ ගෑස් 37.5 kg සිලින්ඩර 06 සැපයිම වෙනුවෙන් ගෙවීම | 123,395.00 |
| | 627 | ඊරියාව ජොෂ්ඨ පුරවැසි සංවිධානය | මිහිඳු මාවත කරුණාරත්නගම පාර බෝක්කු බට යොදා යකඩ රාමුවක් සවි කිරීම සඳහා ගෙවීම | 94,066.77 |
| | 628 | මුදල් භාරකරු | 2026 අප්‍රේල් මසට අදාල ගලි රථ දිරි දීමනා ගෙවීම | 12,600.00 |
| | 629 | ඩබ්.ඩී.එස්.කේ.පියතිලක | අතිකාල දීමනා ගෙවීම | 3,047.50 |
| | 630 | මුදල් භාරකරු | කසල එකතු කරන ට්‍රැක්ටරයේ නලාව අලුතින් යෙදිම සඳහා අතින් වියදම් කළ මුදල් ගෙවීම | 1,000.00 |
| 2026.05.18 | 631 | රඹුක්කන ඔටෝ සර්විස් | 5452-6699 කැබ් රථයේ වාර සේවාව සිදු කිරීම සඳහා ගෙවීම | 24,200.00 |
| | 632 | නාමල් ඔටෝ සර්විස් | SGRG 4334 ට්‍රැක්ටරයේ වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම | 43,535.00 |
| | 633 | මුදල් භාරකරු | 2025 දෙසැම්බර් මස ගලි තැන්පතු ආදායමට ගැනිම | 439,134.99 |
| | 634 | ඩී.එල්.ප්‍රසාද් විමලරත්න | නීතිඥ නඩු ගාස්තු ගෙවීම | 9,000.00 |
| | 635 | පී.ඩී.ඩී.ආර්.පහලවිතාන | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 768.40 |
| | 636 | එස්.එස්.ඉලංගන්තිලක | නීතිඥ නඩු ගාස්තු ගෙවීම | 93,640.00 |
| | 637 | එස්.එස්.ඉලංගන්තිලක | නීතිඥ නඩු ගාස්තු ගෙවීම | 10,510.00 |
| | 638 | කළමණාකරු ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු ගිණුමක් ආරම්භ කිරීම | 50,000,000.00 |
| | 639 | රංජනී බේක් හවුස් | මහ සභාව සංග්‍රහ වියදම් ගෙවීම | 5,427.50 |
| | 640 | නිව් ජෙන් කම්පියුටර් | පරිගණක අලුත් වැඩියා කිරිම වෙනුවෙන් ගෙවීම | 3,000.00 |
| | 641 | නිව් ජෙන් කම්පියුටර් | පරිගණක අලුත් වැඩියා කිරිම වෙනුවෙන් ගෙවීම | 1,500.00 |
| 2026.05.19 | 642 | ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව | ආයුර්වේද සඳහා ඖෂධ මිළදී ගැනිම | 1,000,000.00 |
| 2026.05.20 | 643 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඉන්ධන බිල්පත් ගෙවීම | 564,490.37 |
| | 644 | තිළිණි නිරෝෂණි | ගමන් වියදම් ගෙවීම | 5,092.50 |
| | 645 | බී.ඒ. අසංක හංස කුමාර | ගමන් වියදම් ගෙවීම | 1,379.00 |
| | 646 | ඩබ්.පි.එස්. විජයන්ති | ගමන් වියදම් ගෙවීම | 684.00 |
| | 647 | ඩබ්.පි.එස්. විජයන්ති | ගමන් වියදම් ගෙවීම | 760.00 |
| | 648 | ඩබ්.පි.එස්. විජයන්ති | ගමන් වියදම් ගෙවීම | 737.20 |
| | 649 | තිළිණි නිරෝෂණි | ගමන් වියදම් ගෙවීම | 4,200.00 |
| | 650 | පී.ඩී.ඩබ්.චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 4,200.00 |
| | 651 | මුදල් භාරකරු | 2026 අප්‍රේල් මස සහික දීමනා ගෙවීම | 30,000.00 |
| | 652 | මුදල් භාරකරු | 2026 පෙබරවාරි මස සහික දීමනා ගෙවීම | 15,000.00 |
| | 653 | ලේඛා ස්ටේෂනරීස් | රඹුක්කන මහජන පුස්තකාල පුවත්පත් බිල්පත් ගෙවීම | 19,350.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 654 | ලේඛා ස්ටේෂනරීස් | රඹුක්කන මහජන පුස්තකාල පුවත්පත් බිල්පත් ගෙවීම | 15,370.00 |
| | 655 | ලේඛා ස්ටේෂනරීස් | ඉඹුල්ගස්දෙනිය මහජන පුස්තකාල පුවත්පත් බිල්පත් ගෙවීම | 11,610.00 |
| | 656 | ලේඛා ස්ටේෂනරීස් | ඉඹුල්ගස්දෙනිය මහජන පුස්තකාල පුවත්පත් බිල්පත් ගෙවීම | 15,790.00 |
| 2026.05.21 | 657 | මුදල් භාරකරු | 2026 මැයි මස ස්ථිර සේවක වැටුප් ගෙවීම | 8,262,512.26 |
| 2026.05.22 | 658 | එච්.ඒ.ආර්.එම්.කේ .හෙට්ටිආරච්චි | නඩු කටයුතු සඳහා ඡායාරූප මුද්‍රණය සඳහා අතින් වියදම් වූ මුදල් ගෙවීම | 420.00 |
| | 659 | එස්.ජේ.එස්.සමරසිංහ | අතිකාල දීමනා ගෙවීම | 21,543.33 |
| | 660 | එම්.එන්.පද්මසිරි | අතිකාල දීමනා ගෙවීම | 7,490.74 |
| | 661 | එම්.එන්.පද්මසිරි | අතිකාල දීමනා ගෙවීම | 7,490.74 |
| | 662 | ඩබ්.එන්.පුෂ්ප කුමාර | අතිකාල දීමනා ගෙවීම | 3,514.07 |
| | 663 | ජී.ආර්.වයි.සමන් කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 2,546.85 |
| | 664 | එන්.ජී. අජිත් ප්‍රියන්ත | අතිකාල දීමනා ගෙවීම | 7,490.74 |
| | 665 | ඩබ්.ජී.එල්.සුබසිංහ | අතිකාල දීමනා ගෙවීම | 3745.37 |
| | 666 | එස්.ඩබ්.එස්.ශ්‍රියානන්ද | අතිකාල දීමනා ගෙවීම | 4,740.74 |
| | 667 | ජී.ඩබ්.ජී.ඒ. සඳරුවන් | අතිකාල දීමනා ගෙවීම | 7,407.41 |
| | 668 | වී.ඒ.එස්.ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 3,332.59 |
| | 669 | එච්.ඩබ්.ඒ.අයි.එල්.විරකෝන් | අතිකාල දීමනා ගෙවීම | 7,574.07 |
| | 670 | ජේ.එන්.එල්.ජයසිංහ | අතිකාල දීමනා ගෙවීම | 4,014.25 |
| | 671 | එස්.ඩබ්.පි.ධර්මසේන | අතිකාල දීමනා ගෙවීම | 7,990.74 |
| | 672 | වි.ආර්.එන්.ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 7,667.96 |
| | 673 | ජී.එන්. බන්දුසේන | අතිකාල දීමනා ගෙවීම | 8,314.81 |
| | 674 | බී.ජී.ජී.බී.ඒ. කුමාර් | අතිකාල දීමනා ගෙවීම | 8,875.93 |
| | 675 | එස්.ඩබ්.සී.එස්.නන්දන | අතිකාල දීමනා ගෙවීම | 9,601.85 |
| | 676 | කේ.ජී. ධනුක ශ්‍රීමාල් | අතිකාල දීමනා ගෙවීම | 7,724.82 |
| | 677 | ඊ.එම්.එන්.ඒකනායක | අතිකාල දීමනා ගෙවීම | 8,565.00 |
| | 678 | මුදල් භාරකරු | 7429 කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනිම සඳහා ගත් අත්තිකාරම පියවීම | 15,640.00 |
| | 679 | ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය අලුත්වැඩියා කිරිම - 10% රුඳවුම් මුදල් ගෙවීම | 53,737.71 |
| | 680 | මුදල් භාරකරු | R-C8186 ට්‍රැක්ටරය ,GG2824 යතුරු පැදිය අදායම් බලපත්‍ර ලබා ගැනිම සඳහා අත්තිකාරම් ලබා ගැනිම | 8,500.00 |
| | 681 | ශ්‍රී ලංකා ටෙලිකොම් | දුරකථන බිල්පත් ගෙවීම | 3,095.99 |
| | 682 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | ජල බිල්පත් ගෙවීම | 4,393.54 |
| | 683 | Wiretree (pvt) Ltd | නිල වෙබ් අඩවි නිර්මාණය සඳහා 10% රඳවා ගත් මුදල් ආපසු ගෙවීම | 34,975.00 |
| | 684 | ඩි.එම්.ඩබ්.ඩි.බි. දිසානායක | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 6,281.04 |
| | 685 | ආර්.පි.ඒ. රාජකරුණා | ජල නල ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| | 686 | ඒ.එම්.පි. අලහකෝන් | ජල නල ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| | 687 | ඒ.එම්.සි.ටි.බි. ජයතිලක | ජල නල ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| | 688 | ඩී.පි.එස්.කේ.ජයවර්ධන | ජල නල ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| | 689 | එච්.ඒ. ජේ.ජේමරත්න | ජල නල ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 690 | ජේ.එම්.ජී. ජයවීර | ජල නල ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| | 691 | එච්.ඒ.ඩී.එච්.හෙට්ටිආරච්චි | ජල නල ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| 2026.05.25 | 692 | පී.බී.එන්.යූ.කේ.ඩී. සිල්වා | මාළු කඩ කාමර ගිවිසුම් ඇප මුදල් ආපසු ගෙවීම | 388,695.00 |
| | 693 | එන්.අසෝක රාජකරුණා | මාළු කඩ කාමර ගිවිසුම් ඇප මුදල් ආපසු ගෙවීම | 438,480.00 |
| | 694 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඉන්ධන බිල්පත් ගෙවීම | 259,045.00 |
| | 695 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම | 2,100.00 |
| | 696 | ශ්‍රී ලංකා ටෙලිකොම් | දුරකථන බිල්පත් ගෙවීම | 4,808.22 |
| | 697 | ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුටස් ලංකා (ප්‍රයිවට් ලිමිඩට්) | විදුලි බිල්පත් ගෙවීම | 12,306.84 |
| | 698 | එස්.ඩබ්.පී.එස්.ඩබ්. එම්.ආර්.එස්. බෙලිගොඩපිටිය | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 847.34 |
| | 699 | කේ.ඒ.තමරා රූපිකා | පුස්තකාලය සඳහා පොත් පත් මිළදී ගැනිම | 1,170.00 |
| | 700 | ජී.වයි.මල්ලිකා | ජල නල ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| | 701 | ටී.ඩබ්.කරුණාදාස | ජල නල ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| 2026.05.26 | 702 | දිමුතු ග්‍රාම සංවර්ධන සමිතිය | හිටිනාවත්ත මාර්ගය සංවර්ධනය කිරීම -10% රඳවුම් මුදල් ගෙවීම | 24,664.59 |
| | 703 | සූරම්‍යා සෙරමික් | විද්‍යුත් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 542,655.00 |
| 2026.05.27 | 704 | ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුටස් ලංකා(ප්‍රයිවට් ලිමිඩට්) | රඹුක්කන පොදු වැසිකිලිය හිඟ විදුලි බිල්පත් ගෙවීම | 2,125.42 |
| | 705 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය | රඹුක්කන පොදු වැසිකිලිය හිඟ ජල බිල්පත් ගෙවීම | 19,394.32 |
| | 706 | සර්.ඇන්තනීස් ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | විද්‍යුත් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 42,125.00 |
| | 707 | සර්.ඇන්තනීස් ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | හාඩ්වෙයාර් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 4,470.00 |
| | 708 | සර්.ඇන්තනීස් ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | මාළු කඩ අලුත් වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම | 53,469.00 |
| 2026.05.29 | 709 | සූරම්‍යා සෙරමික් | ජල කරාම සැපයීම වෙනුවෙන් ගෙවීම | 3,600.00 |
| | 710 | සූරම්‍යා සෙරමික් | වයර් රෝල් සැපයීම වෙනුවෙන් ගෙවීම | 5,500.00 |

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මුදල් භාරකරුට දෙසැම්බර් මස ගලි තැන්පතු ආදායමට ගැනීම සඳහා රු.439,134.99 ක් ගෙවීම පැහැදිලි නොමැති බවත්, එය පැහැදිලි කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

සභා ගර්භය ඝෝෂා

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගලි තැන්පතුවෙන් ලද මුදල් එකපාරටම පොදු අරමුදලට තැන්පත් නොකරන බවත්, ලේඛනවල ගිණුම් ගත කිරීමේ ක්‍රමවේදය අනුව කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මෙම මුදල සභා අරමුදලින් හෝ පොදු අරමුදල් වලින් වියදම් කර නොමැති බවත්, ගිණුම්කරණ ක්‍රමවේදය අනුව නම් ගිණුමෙන් ඉවත් කර පොදු අරමුදල් ගිණුමට තැන්පත් කිරීමට යෝජනා කර ඇති බව පැහැදිලි කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

වියදම් වාර්තාවේ අකුරු ඉතා කුඩා බවත්, අවස්ථා කීහිපයකදීම එය නිවැරදි කර දෙන මෙන් ඉල්ලා සිටි බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගුණු බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

2026.04.25 දින සිට 2026.05.31 දක්වා වියදම් පිළිබඳ වාර්තාව අනුමත කිරීමට සඳහා වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).02.ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා**

**i. රඹුක්කන දුම්රියපළ අසල විදුලිපහන් පද්ධතිය විදිමත් ලෙස ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහමමදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා**

දුම්රිය ස්ථානාධිපති සමග මේ සම්බන්ධව සාකච්ඡා කළ බවත්, එහිදී මෙම ව්‍යාපෘතිය සභාව මැදිහත් වී සිදුකර ඇති බවත්, සෝලා පැනල් මගින් ඒ සඳහා විදුලිය ලබාගෙන ඇති බවත්, මේ වන විට ආක්‍රිය තත්ත්වයේ පවතින බවත් ප්‍රකාශ කරන ලදී. තවද , සභාව මැදිහත් වී විදුලි රැහැනකින් විදුලිය ලබාදීම මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමක් සිදුකර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් මේ වන විට නැවතත් එය අක්‍රීයව පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

උපසභාපතිතුමන් විසින් කරුණු ප්‍රකාශ කළ ද මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට යම් මුදලක් වැය වන බවත්, ඒ සම්බන්ධව සටහන් නොවූ බව ප්‍රකාශ කරන ලදී. තමා දන්නා පරිදි මෙම දේපළ සභා දේපළක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. නව රජය පත්වීමත් සමඟ අනවශ්‍ය වීදි පහන් ගලවා ඉවත් කිරීමට තීරණය කර ඇති මොහොතක ආණ්ඩු පක්ෂයේ උපසභාපතිතුමන් මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන විපක්ෂය පුදුමයට පත්වන බවත් ප්‍රකාශ කරන ලදී. මෙම ඉදි කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මැදිහත් වී සිදුකළ බවත්, විදුලි සැපයීම හා නඩත්තුව සම්බන්ධව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කළ බවත් , මෙම දේපළ දුම්රිය දෙපාර්තමේන්තුව සතු බවත් ප්‍රකාශ කරන ලදී. නගරය අලංකාරය සඳහා මෙය ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, මෙම යෝජනාව දුම්රිය දෙපාර්තමේන්තුවට ක්‍රියාත්මක කිරීමට යැවීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා**

අනවසර විදුලි පහන් ගලවා ඉවත් කර ඇති බවත්, අත්‍යවශ්‍ය විදුලි පහන් ගලවා නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. විදුලි පහන් ගලවා ඉවත් කිරීමට තීරණයක් ගෙන නොමැති බවත්, අවම කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තවද, කලින් සිටි සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම දුම්රිය ස්ථානයට යන මාර්ගයේ විදුලි පහන් පද්ධතිය සවිකිරීමට කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

සභා ගර්භය ඝෝෂා

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා**

මෙම විදුලි පහන් පද්ධතිය සම්බන්ධව දුම්රිය කමිටුවක් පවතින බවත්, එහිදී ඔවුන් ප්‍රකාශ කළ පරිදි දේපළ ඔවුන් සතු වුවද පෙර සිටි සභාපතිතුමාගේ අනු දැනුම මත මෙම පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කළ බවත්, සෝලා මඟින් මෙම පහන් ආලෝකමත් වන බවත්, නමුත් බාල බඩු යොදා මෙම විදුලි පහන් පද්ධතිය ස්ථාපිත කර මහජනතාව මුලා කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. කෙසේ හෝ මෙම විදුලි පහන් දැල්වන තත්ත්වයට රැගෙන ආ යුතු බැවින් මෙම යෝජනාව සිදුකළ බවත්, ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම ප්‍රමාණවත් බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කළ යුතු බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නාගරික සංවර්ධන අධිකාරිය මගින් මෙය සංවර්ධනය කර ඇති බවත්, මෙම දේපලේ අයිතිය දුම්රිය දෙපාර්තමේන්තුව සතු බවත්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී ලංකා විදුලි බල මණ්ඩලය මගින් බිල් ගෙවීමේ පදනම මත මීටරයක් සවිකර විදුලිය ලබාදීමට එකඟ වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන් මේ ආසන්නයේ විදුලි රැහැනක් නොමැති බැවින් වීදි පහන් කැටගරියට මෙම ව්‍යාපෘතිය අයත් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ සෝෂා

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සභාවට යෝජනාවක් ඉදිරිපත් කිරීමේදී සියලුම කරුණු කාරණා පිළිබිඹු වන පරිදි ඉදිරිපත් කළ යුතු බවත්, පක්ෂ මන්ත්‍රීවරුන් බුද්ධියෙන් මුහුපුරා ගිය අය වූවාට ඔවුන්ගේ හිතේ ඇති දේ තමන්ට තේරුම් ගත නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනා සම්බන්ධය දැක්වූ අදහස් පරිදි මෙම විදුලි පහන් පද්ධතිය දුම්රිය දෙපාර්තමේන්තුව සතු බැවින් ඔවුන් විසින් මෙය සභාවට පවරා නොදීම මත එහි සංවර්ධන කටයුතු සිදුකළ නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම පවතින රජය විසින් අනවශ්‍ය විදුලි පහන් ඉවත් කිරීමට කටයුතු සිදු කරන විට සභාවට අයත් නොවන දේපළක පවතින විදුලි පහන් පද්ධතියක් සකස් කිරීමට සභා අනුමැතිය ඉල්ලීම අනුමත කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී. තවද, සභාවේ වැඩ කටයුතු ඉටු කර ගැනීමට නොහැකි නම් ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලා අස්වී කළ හැකි අයකුට ලබාදෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපට සභා කටයුතු සිදුකිරීමට හැකියාව පවතින බවත්, එය ඉටුකිරීමට නොහැකි වුවහොත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා ප්‍රකාශ කළ පරිදි තනතුරු භාරදී යාමට සූදානම් බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

මෙම විදුලි පහන් පද්ධතියට සවිකර ඇති බඩු බාල බඩු ලෙස ප්‍රකාශ කළේ කිනම් තොරතුරක් පදනම් කරගෙනද යන්න විමසන ලදී. තවද, වගකීමක් ඇතිව එවැනි ප්‍රකාශය ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ සෝෂා, සභාපතිතුමන් විසින් එය සමථයට පත් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

උපසභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද බාල බඩු යොදවා සෝලා පද්ධතිය ස්ථාපිත කර මහජනතාව මුලා කර ඇති බවත්, නැවත ඒ පිළිබඳව පසු විපරම් සිදු නොකළ බවත් ප්‍රකාශ කරන අතර මෙසේ අර්ථ විරහිත ප්‍රකාශ කිරීම ඵල රහිත බවත්, තම හැකියාව පෙන්වීමට අවශ්‍ය නම් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සංවර්ධන කටයුතු අලුත්වැඩියා කිරීම් සිදුකළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී. තවද, යම් දෙයක අඩුපාඩුවක් පෙන්වා දුන්විට එය පිළිගැනීමට තරම් නිහතමානී විය යුතු බවත් , මෙම යෝජනාව ඉදිරිපත් කිරීමේ පවතින අඩුපාඩු නිසා එය අනුමත කිරීමට නොහැකි බව ප්‍රකාශ කරන අතර එම යෝජනාටව සංශෝධනයක් ඉදිරිපත් කිරීමට කැමති බව ප්‍රකාශ කරන ලදී.

එම සංශෝධිත යෝජනාව, රඹුක්කන දුම්රියපළ අසල විදුලි පහන් පද්ධතිය විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතන දැනුවත් කිරීම සුදුසු බවට යෝජනා කරමි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ඒ ස්ථිර කරන ලදී.

තවද, මහජනතාවට වංචා කළ බව ප්‍රකාශ කළ පරිදි වර්තමානයේ බලය, තනතුර පවතින බැවින් හැකිනම් වංචා කළ අයුරු සොයා ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, අවශ්‍ය නම් ඒ සම්බන්ධව තමාගේ සහයෝගය

ද ලබා ගැනීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම ව්‍යාපෘතිය පවතින ඉහළම තාක්ෂණය හා සූර්ය බලය උපයෝගී කරගෙන සකසා ඇති බවත්, එහි අඩුපාඩු පවතී නම් ඒවා නිවැරදි කිරීම සිදු කළ යුතු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බලශක්තිය අපතේ නොයවා ආරක්ෂා කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. තවද, සභාව විසින් සභා තීරණයක් ගත්විට එය කුමන ආණ්ඩුවක් යටතේ වුවද බලාත්මක බවත්, පවතින ආණ්ඩු විසින් එය යථාර්ථයක් කරගැනීමට කටයුතු කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

රීති ප්‍රකාරව යම් මන්ත්‍රීවරයකු යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් පසුව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මන්ත්‍රීතුමන්ලාට / තුමියන්ලාට ඒ සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවක් පවතින බවත්, දිගින් දිගට හිතුමතේ අදහස් ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වී මත කාලය කළමනාකරණය කර ගත නොහැකි බවත්, එක් අවස්ථාවකදී පැවසීමට ඇති සියල්ල ප්‍රකාශ කිරීමට කටයුතු කරන ලෙසට අවවාද කරන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා**

තමා වසර 10 ටත් අධික කාලයක් මෙම මාර්ගය භාවිතයට ගන්නා පුද්ගලයකු බවත්, එහිදී මෙම ව්‍යාපෘතිය සිදුකළ ද කිසිදු අලුත්වැඩියාවක් සිදුකරනු නොලැබූ බවත්, ආරම්භයේදී ඉතා අලංකාරව තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා, සභාපතිතුමන් විසින් එය සමථයකට පත් කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සංශෝධිත යෝජනාව සම්බන්ධව බෙදීමට අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රඹුක්කන දුම්රිය පොළ අසල විදුලි පහන් පද්ධතිය විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතන දැනුවත් කිරීම සුදුසු බවට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

i. **නගරාසන්නයේ ව්‍යාපාරික ස්ථාන සඳහා ජල සබඳතා ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන මෙන් අදාළ ආයතන දැනුවත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගිය සභාවාරයේ න්‍යාය පත්‍රයට දැමීමට යෝජනා කළ නමුත් සන්නිවේදන දුර්වලතාවයක් නිසා එය එදින න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කළ අතර විශේෂයෙන්ම මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතුව ලෙස වහව ප්‍රදේශයේ වහව පාලමට පෙර නව ව්‍යාපාරික ස්ථාන කීහිපයක් පවතින බවත් , දිට්වා ව්‍යසනය සමඟ රඹකැන් ඔය පිටාර ගැලීමත් සමඟ එම ව්‍යාපාරික ස්ථාන ජලයෙන් යට වූ බවත්, එහිදී එම අපද්‍රව්‍ය සෝදා ඉවත්කර ගැනීමටවත් ජල පහසුකම නොතිබූ බව ව්‍යාපාරික මහතුන් තමා දැන්වූ බවත් , ජල පහසුකම් ඉල්ලා මීට වසර 1 ½ ක පමණ ඉහත ඉල්ලීම් කර තිබුණු ද තවම ජල සැපයුම ලබාදී නොමැති බව

දන්වා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එසේම මේ ව්‍යාපාරික ස්ථාන වලින් ව්‍යාපාරික බදු අය කරන බැවින් ඔවුන්ගේ (මහජනතාවගේ ) ඉල්ලීම් ද ඉටු කිරීමට සභාවක් හැටියට අප නම්‍යශීලී විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

පෙ.ව.12.29 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා සභා ගර්භයෙන් ඉවත්ව යන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
වෙන වෙනම ඒ ඒ ව්‍යාපාරිකයින් ඉල්ලුම් කර ඇතිද යන්න විමසන ලද අතර එසේ ඉල්ලීම් කර ඇත්නම් ඔවුන්ගේ ඉල්ලීම් ලිපියක්ද ලබා ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
ව්‍යාපාරික මහතුන් ඉල්ලීම් කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
නගරාසන්නයේ ව්‍යාපාරික ස්ථාන සඳහා ජල සබඳතා ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන මෙන් අදාළ ආයතන දැනුවත් කිරීමට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

i. **මල්මීය අඹතැන්න හරහා හීනාබෝව මාර්ගයේ කාණු සහ බෝක්කු පද්ධතිය පිළිසකර කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**
දිට්වා ආපදාව සමඟ මෙම මාර්ගය ආපදාවට ලක් වූ බවත්, දීර්ඝ කාලයක සිට ජලය ගලා යාමේ කානු පද්ධතිය අවහිරව පවතින බවත්, කාණු පද්ධතිය ගොඩ කර බෝක්කු පිළිසකර කර කොන්ක්‍රීට් කර ඇති ස්ථානවල කොන්ක්‍රීට් තට්ටු කැඩී ඇති බවත්, එය පිළිසකර කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
පොදු අරමුදල් යෙදවිය නොහැකි බවත්, පළාත් සභා අරමුදල් යෙදවීමට යටත්ව මල්මීය අඹතැන්න හරහා හීනාබෝව මාර්ගයේ කාණු සහ බෝක්කු පද්ධතිය පිළිසකර කිරීමට අදාළ යෝජනාව එකමතිකව සභා සම්මත විය.

ii. **මල්මීය අඹතැන්න හරහා හීනාබෝව මාර්ගයේ පොල්ගස් තුන අසල බෝක්කුව හරහා ඇති කාණුව සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින්**

**යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

පොල් ගස් තුන අසල බෝක්කුව මේ වන විට පස් පිරී ඇති බැවින් වර්ෂා කාලයේදී මාර්ගය ජලයෙන් යටවන බවත්, ප්‍රධානම ඇල මාර්ගය ගොඩ වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. බෝක්කුව අවහිරවී ඇති බැවින් වගා කටයුතු වලට හානි සිදුවන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

පොදු අරමුදල් යෙදවිය නොහැකි බවත්, පළාත් සභා අරමුදල් යෙදවීමට යටත්ව මල්මීය අඹතැන්න හරහා හීනාබෝව මාර්ගයේ පොල්ගස් තුන අසල බෝක්කුව හරහා ඇති කාණුව සංවර්ධනය කිරීමට අදාළ යෝජනාව එකමතිකව සභා සම්මත විය.

iii. **ආදාපාන පාලම ආසල සිට හීනාබෝව හරහා අඩනැල්ල මාර්ගයේ කන්සලගමුව අරක්බඩ කුඹුරු යායට පිවිසීම දක්වා ඇති කොටස (ප්‍රාදේශීය සභා මාර්ගයකි) මිනුම් කටයුතු කර සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහමමදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

අක්කර 23 ක පමණ වූ කුඹුරු යායකට වසර ගණනාවක් තිස්සේ භාවිතා කරන මාර්ගයක් වන මෙය 1993.01.27 ගැසට් වී ඇති බවත්, හීනාබෝව, කන්සලගමුව ආදී ගොවි සංවිධාන මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, ප්‍රාදේශීය සභාවට , බෞද්ධ කටයුතු අමාත්‍යාංශයට, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ආදී ස්ථාන දැනුවත් කර ඇති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.
මෙම ප්‍රාදේශීය සභා මාර්ගය මීට වසර 02 කට පෙර වසා දමා ඇත්තේ මේ වන විට විශ්‍රාම ගොස් සිටින හිටපු ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුර දැරූ ප්‍රියන්ති නැමැත්තිය විසින් බව විශේෂයෙන් ප්‍රකාශ කරන ලදී. මේ වන විටත් මේ සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රාදේශීය සභාවෙන් කිසිදු පියවරක් මේ වන තෙක් මේ සම්බන්ධය ගෙන නොමැති බවට අබූත චෝදනාවක් එල්ල කළ බවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් ,දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට කැඳවා මේ සම්බන්ධව කරුණු විමසා ඇති බවත්, ප්‍රාදේශීය ලේකම් විසින් මිනුම් කටයුතු සිදු කිරීමට ඇති බවත්,මේ වන විට ඊට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතින බැවින් යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව ප්‍රකාශ කරන ලදී. තවද, සාවද්‍ය තොරතුරු සභාගත කිරීමට කටයුතු නොකරන ලෙසට අවවාද කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

ආදාපාන පාලම ආසල සිට හීනාබෝව හරහා අඩනැල්ල මාර්ගයේ කන්සලගමුව අරක්බඩ කුඹුරු යායට පිවිසීම දක්වා ඇති කොටස (ප්‍රාදේශීය සභා මාර්ගයකි) මිනුම් කටයුතු කර සංවර්ධනය කිරීමට අදාල යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප විය.

**(ඊ).05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

i. **මහසභාව පවත්වන දිනයේ ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා හට හාෆ්ෂීට් කොළයක් ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

1997 වසරේ සිට සිටින මහජන නියෝජිතයකු වන තමා එදා සිට පවතින රජයට පෙර පැවති සෑම සභාවාරයකදීම සභා රැස්වීමට පැමිණෙන විට සෑම සභික මහත්ම / මහත්මියකුටම හාෆ්ෂීට් කොළයක් දෙකක් ලැබුණු බවත්, මේ සම්බන්ධ චෝදනා එල්ල විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ සෝෂා, සභාපතිතුමන් විසින් සමථයකට පත් කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මන්ත්‍රීතුමාගේ එම ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ සෝෂා, සභාපතිතුමන් විසින් සමථයකට පත් කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීවරුන් හට තමා අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව පවතින බවත්, එතුමාගේ අදහස් දැක්වීමෙන් අනතුරුව ඊට විරුද්ධත්ව හෝ පක්ෂව අදහස් දැක්වීමේ හැකියාව අනෙකුත් මන්ත්‍රීවරුන් හට තිබෙන බවත්, කෙනෙකුගේ අදහස් ප්‍රකාශ කිරීමේදී බාධා ඇති නොකරන ලෙස ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ සෝෂා, සභාපතිතුමන් විසින් සමථයකට පත් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

තම ප්‍රකාශය ඉල්ලා අස්කර නොගන්නා බවත් ප්‍රකාශ කළ අතර පවතින ආර්ථික තත්ත්වය හමුවේ හා සභාවක ගෞරවාන්විත භාවය උදෙසා මෙවැනි යෝජනාවක් සිදුකළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ලස්සන ශ්‍රී ලංකාවක් පොහොසත් රටක් යන තේමාව පෙරදැරි කරගෙන පැමිණි ආණ්ඩුවෙන් මේ යෝජනාවටම වසරකට පැනකුත් ඇතුලත් කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

මහසභාව පවත්වන දිනයේ ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා හට හාෆ්ෂීට් කොළයක් ලබා දීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ii. **ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා හට ලබා දෙන කිලෝමීටරයට රු.10.00 ක ඉන්ධන සලාක මුදල ප්‍රතික්ෂේප කරන බවට දන්වා ගරු ආණ්ඩුකාරතුමියට දන්වා යැවීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

ප.ව.12.49 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා සභා ගර්භයෙන් ඉවත්ව යන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

¼ km වත් නොමැති රඹුක්කන නගරයේ සිට මෙම ස්ථානයට පැමිණීමටත් රු.30.00 වැනි මුදලක් අය කරන බවත් මසකට රු.300.00 ලිපිද්‍රව්‍ය දීමනාවක් එකල ලැබුණු බවත්, සංවර්ධන යෝජනා සඳහා ලක්ෂ 1.5 /02 ක් වැනි ප්‍රතිපාදන ලැබුණ බවත්, මේ වන විට එය කප්පාදු කර ඇති බවත්, රු.8000.00 ක දීමනාවක් ලැබුණු බවත්, එය ද මේ වන විට කප්පාදු කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මහජන නියෝජිතයෝ සියලු දෙනාට සභාවට පැමිණ අවශ්‍ය කටයුතු සිදුකර ගැනීමට ස්ථානයක් පැවැති බවත්,මේ වන විට එය ඉබි යතුරු දමා අගුලා ඇති බවත්, ඒ සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන බවත් ප්‍රකාශ කරන ලදී. තවද, සභා රැස්වීම පැවැත්වෙන දිනයන්හි දී ලබාදුන් සංග්‍රහය මේ වන විට නවතා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව පවතින අනපණත් නීති රීති අධ්‍යයනය කර මීට පෙර සිදු කරන ලද එම ගෙවීම් වලට අදාළ නීතිමය ක්‍රියාමාර්ගය ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. එසේ ක්‍රියාමාර්ග නොගන්නේ නම් මීට පෙර ලබාදුන් ලිපිද්‍රව්‍ය වියදම් රු.300.00 සහ දුරකථන හා ඉන්ධන වියදම් ලෙස රු.8000.00 ක මුදල ලබන සභා වාරයේ සිට සහභාගී වන මන්ත්‍රීතුමන්ලාට/ තුමියන්ලාට ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. ජනාධිපතිතුමන් සැමට එක නීතියක් යන්න දිගින් දිගටම ප්‍රකාශ කළද මේ වනතෙක් එය ක්‍රියාවට නංවා ඇති බවක් නොපෙනෙන බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා, සභාපතිතුමන් විසින් සමථයකට පත් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ගලිසේවාව ලබා ගන්නා මහජනතාවගෙන් 1 km ක් සඳහා රු.100.00 අය කිරීමත් මහජන නියෝජිතයින් වන අපට 1 km ක් සඳහා රු.10.00 ලබාදීම සාධාරණ නොමැති බැවින් එම සේවාව සඳහා ද රු.10.00 අය කිරීමට හෝ අපගේ දීමනාව රු.100.00 ක් ලබාදීම සිදුකිරීම එනම් සැමට සාධාරණය ඉටු කිරීම සිදුකළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නීති අංශයට මේ සම්බන්ධ කරුණු විමසා යැවීම සුදුසු බවත්, චක්‍රලේඛ අණපනත් අනුව දිගින් දිගටම මෙම රු.8000.00 සම්බන්ධව සාකච්ඡා කළ බවත්, එහිදී එම වියදම ප්‍රතිපූර්ණය කිරීමේ පදනමට ලබාදෙන දීමනාවක් බව පැහැදිලි කර දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. රීති සම්බන්ධව සභා තීරණයක් ගත නොහැකි බැවින් ඔබතුමාගේ යෝජනාවට එකඟතාවය ලබාදීය නොහැකි බව ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා හට ලබා දෙන කිලෝමීටරයට රු.10.00 ක ඉන්ධන සලාක මුදල ප්‍රතික්ෂේප කරන බවට දන්වා ගරු ආණ්ඩුකාරතුමියට දන්වා යැවීම අදාළ යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප විය.

**iii.** **ගංගොඩ මාකඩවර මාර්ගය හා කිරියාතැන්න මාර්ගය සම්බන්ධ කිරීමට මාවනැල්ල ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීම් කර යැවීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මීටර් 71 ප්‍රමාණයක් මාවනැල්ල ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රමාණයක් සංවර්ධනය කර නොමැති කොටස සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන දෙන මෙන් මාවනැල්ල ප්‍රාදේශීය සභාවට දැනුවත් කිරීමක් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

ගංගොඩ මාකඩවර මාර්ගය හා කිරියාතැන්න මාර්ගය සම්බන්ධ කිරීමට මාවනැල්ල ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීම් කර යැවීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**iv.** **ගංගොඩ මාකඩවර මාර්ගයට අවහිර විදුලි කණු ආධාරකය ඉවත් කිරීමට ලංකා විදුලි බල මණ්ඩලයට දන්වා යැවීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ආධාරකයක් අවශ්‍ය නොමැති කණුවක් බවත්, මාර්ගය තුළ මෙම ආධාරක කණුව ස්ථානගත කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තවද , ලංකා විදුලි බල මණ්ඩලය විසින් විදුලි රැහැන් සඳහා කණු ස්ථානගත කිරීමේදී ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය බව දන්වා යැවිමක් සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

ගංගොඩ මාකඩවර මාර්ගයට අවහිර විදුලි කණු ආධාරකය ඉවත් කිරීමට ලංකා විදුලි බල මණ්ඩලයට දන්වා යැවීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

**i.** **පත්තම්පිටිය ආනන්ද කඩය අසලින් දුම්රියපොළ දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

2026 අයවැය යෝජනාවක් වන මෙය කඩිගමුව දුම්රියපොළ දක්වා දිවෙන මාර්ගයක් බවත්, මෙම මාර්ගයේම ගමේ පන්සල පිහිටා ඇති බැවින් මහජන සුභ සිද්ධිය උදෙසා මෙම මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා අරමුදලින් මෙවැනි විශාල ව්‍යාපෘතියක් සිදුකළ නොහැකි බවත්, ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබාගෙන පොදු අරමුදල් මේ සඳහා යොදවා ගැනීමට කටයුතු සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මෙම

යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

පත්තම්පිටිය ආනන්ද කඩය අසලින් දුම්රියපොළ දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා**

i. **හේවාදිවෙල මහගම සිට ගම්බල හුළංකඩ දක්වා වූ මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා**

මෙම මාර්ගයේ ඉතා අබලන් මට්ටමක පවතින බැවින් කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තාක්ෂණික නිලධාරීන් මෙම මාර්ගය අධීක්ෂණයට යොදවා වාර්තාවක් ලබා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

හේවාදිවෙල මහගම සිට ගම්බල හුළංකඩ දක්වා වූ මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ii. **හේවාදිවෙල හල්වත්ත වසමේ අලුත්වත්ත මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා**

මෙම මාර්ගය ද දීර්ඝ කාලයකින් සංවර්ධනය සිදු නොවූ මාර්ගයක් බවත්, මාර්ග මැදට වන්නට විශාල ගල් පැදී මාර්ගය සෝදා පාළුවට ලක්ව ඇති බැවින් හා වර්ෂා කාලයේදී භාවිතා කිරීම අපහසු බැවින් කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තාක්ෂණය නිලධාරීන් යොදවා මාර්ගය සම්බන්ධ තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීමත්, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමත් සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

හේවාදිවෙල හල්වත්ත වසමේ අලුත්වත්ත මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**iii. හේවාදිවෙල මාළිගාතැන්න මාර්ගයේ පැතිබැම්මක් යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා**

බෑවුම් සහිත ස්ථානයක් මෙම මාර්ගයේ පවතින බවත්, අධික වැසි තත්ත්වයත් සමග මාර්ගය ඛාදනයට ලක්වී ඇති බැවින් පැති බැම්මක් යොදා මාර්ගය ආරක්ෂා කර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තාක්ෂණය නිලධාරින් යොදවා මාර්ගය සම්බන්ධ තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීමත්, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමත් සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

හේවාදිවෙල මාළිගාතැන්න මාර්ගයේ පැතිබැම්මක් යොදා සංවර්ධනය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

01.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
02.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
03.ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
04. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා

යන මන්ත්‍රීවරුන් ප.ව.13.07 ට සභාගර්භයෙන් ඉවත්ව යන ලදී.

**(ඊ).08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා (කාර්මික සේවා කමිටු සභාපති)**

**i. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත සින්නක්කර පැවරී ඇති ඇත්වටේ වත්ත නිවාස ක්‍රමයේ මාර්ග ඇතුළු පොදු දේපළ සභාව වෙත සින්නක්කරවල ලබා ගැනීම සඳහා,**

- **මෙම ඉල්ලීමට අනුව සභාවට භාරදීමට නියමිතව ඇත්තේ පොදු මාර්ගයකි.**
- **මාර්ගයක් ලියාපදිංචි කිරීමට පහත නිර්ණායක අවශ්‍ය වේ.**
  - **මාර්ගයේ පළල (අඩි 10)**
  - **මාර්ගයේ දිග**
  - **මාර්ගය වෙනත් මාර්ගයට සම්බන්ධ නොවේ නම් වාහන හැරවීම සඳහා මීටර් නමයක විෂ්කම්භයක් සහිත හැරවුම් ස්ථානයක්**
  - **විධිමත් කානු පද්ධතියක්**
  - **මීටර් 30ට වැඩි නම් මීටර් 30න් 30ට වාහන හුවමාරු ස්ථානක්**
  - **මේ සියල්ල ඇතුළත්ව භූමිය සලකුණු කරදීම.**

**එම නිසා ඉහත කරුණු සපුරාදෙන මෙන් නිවාස සංවර්ධන අධිකාරියට දැනුම් දීම සුදුසු බවට කාර්මික සේවා කමිටු සභාපති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාර්ගයක් ලියාපදිංචි කිරීමේදී ඉහත නිර්ණායක සපුරා තිබිය යුතු බවත්, එම නිර්ණායක මත පදනම්ව පිඹුරක් සහිතව සභාවට පවරා ගත යුතු බවත්, එසේ නොමැතිව සභාවට පවරා නොගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. ඒ

අනුව නිවාසා සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය –**
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත සින්නක්කර පැවරී ඇති ඇත්වටේ වත්ත නිවාස ක්‍රමයේ මාර්ග ඇතුළු පොදු දේපළ සභාව වෙත සින්නක්කරවල ලබා ගැනීම සඳහා,

- මෙම ඉල්ලීමට අනුව සභාවට භාරදීමට නියමිතව ඇත්තේ පොදු මාර්ගයකි.
- මාර්ගයක් ලියාපදිංචි කිරීමට පහත නිර්ණායක අවශ්‍ය වේ.
    - මාර්ගයේ පළල (අඩි 10)
    - මාර්ගයේ දිග
    - මාර්ගය වෙනත් මාර්ගයට සම්බන්ධ නොවේ නම් වාහන හැරවීම සඳහා මීටර් නමයක විෂ්කම්භයක් සහිත හැරවුම් ස්ථානයක්
    - විධිමත් කානු පද්ධතියක්
    - මීටර් 30ට වැඩි නම් මීටර් 30න් 30ට වාහන හුවමාරු ස්ථානක්
    - මේ සියල්ල ඇතුළත්ව භූමිය සලකුණු කරදීම.

එම නිසා ඉහත කරුණු සපුරාදෙන මෙන් නිවාස සංවර්ධන අධිකාරියට දැනුම් දිම සුදුසු බවට වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යථා පරිදි කල් දී නොමැති යෝජනා**
**(ඊ).01.II.01**

**අංක PF – 7429 දරණ Cab රථය 2025.11.28 දින රඹුක්කන වහව වල්ආර පාලම අසලදී ජල ගැන්මකට හසු වී අනතරක් සිදු වී ඇති අතර ඒ සඳහා මේ වන විට මුලික විමර්ශනයක් ද ක්‍රියාත්මක වෙමින් පවතී. එම අනතුරට සම්බන්ධ අලුත්වැඩියාවන් සිදු කිරීමෙන් පසු අදාළ අලුත්වැඩියාවන් සිදු කළ අනුමත ගරාජයක් වන තරිඳු මෝටර්ස් වෙතින් රු.764,090.00 ක වටිනාකමක් සහිත බිල්පත් ඉදිරිපත් කර ඇත.**

**අදාළ බිලිපත්වල මුල් පිටපත් රක්ෂණ සමාගම වෙත රක්ෂණ හිමිකම ලබා ගැනිම සඳහා යොමු කර ඇත. ඒ සඳහා රු.358,371.96 ක මුදලක් සඳහා පමණක් චෙක්පතක් ඉදිරිපත් කර ඇති අතර ඉතිරි මුදල වන රු.405,718.04 පිළිබඳ රක්ෂණ ආයතනයෙන් විමසීම් කර ඇත. එම තත්ත්වය මත අදාළ ගරාජය වෙත ඉල්ලුම් කර ඇති මුදල ගෙවීම පිළිබඳ ඉදිරි අනුමැතියන් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.**

**එහිදී මෙම ගෙවීම් කටයුතු සඳහා මහසභා තීරණයක් ගැනීම සුදුසු බවට වන යෝජනාව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

රක්ෂන සමාගම විසින් ගෙවීම් කිරීම පැහැර හරින බව පෙනෙන බැවින් රක්ෂණ සමාගම වෙනස් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දිගින් දිගටම මෙම ප්‍රශ්නය පැන නැඟී ඇති බැවින් ඉතිරි මුදල ලබා ගැනීමට අවශ්‍ය සාකච්ඡා කරමින් සිටින බවත්, ඔවුන් සම්පූර්ණ මුදලම ගෙවීමට අපොහොසත් වුවහොත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා ප්‍රකාශ කළ පරිදි රක්ෂණ සමාගම මාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

මෙම අනතුර සම්බන්ධව පරීක්ෂණ කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බවත්, ඒ අනුව තීරණයකට ඒම සුදුසු බවත්, සභාරමුදල් යෙදවීමට ඉක්මන් නොවිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

රක්ෂණ සමාගම ලබාදී ඇති රු.358,371.96 ක මුදල අලුත්වැඩියා සිදු කළ ආයතනයට ලබාදීමටත්, පරීක්ෂණ කටයුතු අවසන් වූ පසු රු.405,718.04 ක මුදල ගෙවීම සම්බන්ධව තීරණය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

රක්ෂණ සමාගමෙන් ලැබුණු මුදල අලුත්වැඩියා කළ ආයතනයට ගෙවීම සම්බන්ධව ගැටළුවක් නොමැති බවත්, නමුත් හදිසි යෝජනාවක් ලෙස ඉදිරිපත් කර ඇති මෙම යෝජනාව ඊළඟ සභාවාරයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර සාකච්ඡාවට ගැනීම සුදුසු බවත්, ලිපි ගොනු පරීක්ෂා කර බැලිය යුතු බවත් , ලිපි ගොනුවල අඩුපාඩු පැවැති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

ලිපිගොනු පරීක්ෂා කර බලා අඩුපාඩු නිවැරදි කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ලිපිගොනුවල ගැටළු පවතිනම් සහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් නොකරන බවත්,පළාත් පාලන කොමසාරිස්, විගණන ආයතනයට මෙම තොරතුරු ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙම මුදල ගෙවීම සම්බන්ධව පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් දෙගිඩියාවකින් සිටින බැවින් රහස් ඡන්දයක් විමසීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

රක්ෂණ සමාගම විසින් ගෙවා ඇති මුදල වන රු.358,371.96 ක මුදල අදාළ ආයතනයට ගෙවීම සම්බන්ධ විරුද්ධත්වයක් නොමැති බවත්, ඉතිරි මුදල ලබා නොදීම සම්බන්ධව රක්ෂණ සමාගම විසින් විමසා ඇති බැවින් ඊට පිළිතුරු ලැබෙන තෙක් සිටීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රක්ෂණ සමාගම විසින් ඉදිරිපත් කළ ඇති රු.358,371.96 ක මුදල අදාළ අලුත්වැඩියාව සිදු කළ ආයතනයට ගෙවීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතා පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රක්ෂණ සමාගම මඟින් ලැබී ඇති රු. 358,371.96 ක මුදල තරිඳු මෝටර්ස් ආයතනය වෙත ගෙවීමට ඒකමතිකව සභා සම්මත විය.

## (ඊ).01.II.02

**රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබාදීම වැඩ සටහන යටතේ සභාව සතු තල්දැව වසමේ සංචාරකයන් සඳහා අවන්හලක්, විවේකාගාරයක් හා රථගාලක් ඉදිකිරීම සඳහා වන ව්‍යාපෘති යෝජනාවක් සහ මිලියන 20 ක් වටිනා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලදී. එහිදී මෙම ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් රු මිලියන 10 ක ප්‍රතිපාදන මුදලක් ලබා දෙන අතර ඉතිරි මිලියන 10 ක මුදල සභා අරමුදලින් දැරීමට සිදුවේ. එබැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

ප.ව.13.54 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටත්ව යන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අධිවේගී මාර්ගය විවෘත කිරීමත් සමඟම ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස සකස් කිරීමට තීරණය කළ බව ප්‍රකාශ කරන ලදී. විද්‍යුත් වාහන සඳහා විදුලි ආරෝපිත ස්ථානයක්, ළමා උද්‍යානයක්, ඔය පාදක කරගෙන ගිමන්

නිවා ගැනීමට ස්ථානයක්... ආදී සංචාරක කලාපයක් ඇති කිරීම මින් අදහස් කර ඇති බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව බෙදීමට අවශ්‍යතාව පැවතී ද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබාදීම වැඩ සටහන යටතේ සභාව සතු තල්දැව වසමේ සංචාරකයන් සඳහා අවන්හලක්, විවේකාගාරයක් හා රථගාලක් ඉදිකිරීම සඳහා වන ව්‍යාපෘති යෝජනාවක් සහ මිලියන 20 ක් වටිනා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලදී. එහිදී මෙම ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් රු මිලියන 10 ක ප්‍රතිපාදන මුදලක් ලබා දෙන අතර ඉතිරි මිලියන 10 ක මුදල සභා අරමුදලින් දැරීමට සිදුවේ. එබැවින් ඒ සඳහා සභා අනුමැතිය ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඊ).01.II.03

**2026 පොදු අරමුදල් යටතේ ඉටුකිරීමට යෝජිත මල්බෙරිවත්ත කැබලි අංක 02 හා කැබලි අංක 09 අතර ඇති කොන්ක්‍රීට් කාණුවෙන් ගලා එන ජලය මාර්ගයේ ඇති බෝක්කුව දෙසට යොමු කිරීම සඳහා වන ඇස්තමේන්තුව 2026 නව මිල යටතේ සකස් කළ අතර එම මුදල වන රු.670,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව බෙදීමට අවශ්‍යතාව පැවතී ද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

2026 පොදු අරමුදල් යටතේ ඉටුකිරීමට යෝජිත මල්බෙරිවත්ත කැබලි අංක 02 හා කැබලි අංක 09 අතර ඇති කොන්ක්‍රීට් කාණුවෙන් ගලා එන ජලය මාර්ගය බෝක්කුව දෙසට යොමු කිරීම සඳහා වන ඇස්තමේන්තුව 2026 නව මිල යටතේ සකස් කළ අතර එම මුදල වන රු.670,000.00 ක ඇස්තමේන්තුව අනුමැතියට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඊ).01.II.04

**ඉන්ධන පිරවුම්හල අසල සිට වහව දක්වා දිවෙන ප්‍රධාන කුණු ඇල Excavator යන්ත්‍ර යොදවා පිරිසිදු කිරීම සඳහා සකස් කරන ලද රු.72,000.00 වන ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව බෙදීමට අවශ්‍යතාව පැවතී ද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

ඉන්ධන පිරවුම්හල අසල සිට වහව දක්වා දිවෙන ප්‍රධාන කුණු ඇල Excavator යන්ත්‍ර යොදවා පිරිසිදු කිරීම සඳහා සකස් කරන ලද රු.72,000.00 වන ඇස්තමේන්තුව අනුමැතියට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඊ).01.II.05

**රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණයේ කොන්ත්‍රාත් කාල සීමාව 2026.06.14 දින සිට 2026.12.14 දින දක්වා මාස 06 කින් දීර්ඝ කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ සඳහා මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

යථා පරිදි කල් දී ඇති යෝජනා අංක vii යටතේ මෙම යෝජනාව ද සාකච්ඡාවට භාජනය කරන ලද බව ප්‍රකාශ කළ අතර මේ සම්බන්ධව බෙදීම අවශ්‍යතාවක් පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණයේ කොන්ත්‍රාත් කාල සීමාව 2026.06.14 දින සිට 2026.12.14 දින දක්වා මාස 06 කින් දීර්ඝ කර දෙන ලෙස ඉල්ලා මහසභා අනුමැතියට ඉදිරිපත් කළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(උ).කාරක සභා වාර්තා ඉදිරිපත් කිරිම.**
**කාර්මික කමිටු වාර්තාව**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

කාර්මික කමිටු සාමාජිකයින්ගේ යෝජනාවක් මත බොබ්කැට් යන්ත්‍රය සහ ගලිබවුසරය සම්බන්ධව නිරීක්ෂණයක් සිදු කර එහි වාර්තාවක් ලබාගත් බවත්, එම නිරීක්ෂණ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව නව යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නිරීක්ෂණ කමිටුවෙහි හා කාර්මික කමිටුවෙහි නිර්දේශය කුමක්දැයි විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා**

ලක්ෂ 50 වඩා වැඩි මුදලක් අලුත්වැඩියාව සඳහා වැය වේ යැයි අපේක්ෂා කරන අතර එබැවින් නව යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අලුත්වැඩියාව සඳහා ලක්ෂ 50 පමණ වැය වන බැවින් අලුත්වැඩියා නොකර නව යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බව කාර්මික කමිටු වාර්තාවේ ඇතුළත් කර තිබේද යන්න විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා**

වාහන අලුත්වැඩියා කරන ස්ථානයේ මෙය බොබ්කැට් යන්ත්‍රයක්ද යන්නවත් හඳුනාගත නොහැකි ලෙස කොටස් ගලවා ඇති බවත් , එන්ජින් එකේ සිට සියලුම කොටස් අලුතින් සැකසීමට සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බොබ්කැට් යන්ත්‍රය කැඩී මේ වන විට මාස 06 ත් වඩා වැඩි කාලයක් ගතවී ඇති බවත්, වාහන අලුත් වැඩියා කලට වේලාවට සිදු කළ යුතු බවත්, එසේ නොමැතිව අලුත්වැඩියා සිදු නොකර විවිධ වූ හේතු ඉදිරිපත් කිරීම කාලෝචිත නොවන බවත් ප්‍රකාශ කරන ලදී. සභාවේ කසල අංගනය කළමනාකරණය කිරීමට බාහිරින් ස්කැවේටර් යන්ත්‍රයක් ගැනීමට සිදුවූ බවත්, ඒ සඳහා ලක්ෂ 02 ක ඇස්තමේන්තුවක් ගිය සභා වාරයේදී අනුමත කරගත් බවත් ප්‍රකාශ කරන ලදී. තවද, බොබ්කැට් යන්ත්‍රය නොමැති වීම මත කසල අංගනය මේ වන විට ගැටළු සහගත තත්ත්වයකට මුහුණපා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. කාර්මික කමිටුවට මේ සම්බන්ධව තීරණයක් ගැනීමට නොහැකි වීම ගැන කණගාටුව ප්‍රකාශ කරන බවත්, නිරීක්ෂණ වාර්තා වෙන්ද නිශ්චිත පිළිතුරක් ලබා

නොදීම මත සභාවට තීරණයක් ගත නොහැකි බවත්, විගණනයට මෙය තුඩුදෙන කරුණක් වීම වැළැක්විය නොහැකි බවත්, හැකි ඉක්මනින් මේ සම්බන්ධව නිර්දේශයක් ලබාදෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා**

කසල අංගනයේ දෛනික වැඩකටයුතු සිදුකර ගැනීම සඳහා බොබ්කැට් යන්ත්‍රයක් හෝ ස්කැවේටර් යන්ත්‍රයක් කුලී පදනමට ලබා ගැනීම සුදුසු බව යෝජනා කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

යන්ත්‍රයක් කුලී පදනමට ගැනීමට කාර්මික කමිටු නිර්දේශයක් අවශ්‍ය නොමැති බවත්, සභාවේ කාර්මික කමිටුව එල රහිත බව තමාට හැඟෙන බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම බොබ්කැට් යන්ත්‍රය හීට් (රත්වීම) මත ද අලුත්වැඩියාව යොමු කළ බවත්, මේ වන විට යන්ත්‍රය හඳුනා ගැනීමට නොහැකි ලෙස කොටස් ගලවා ඇති බවට වාර්තා වන බවත්, එහි එන්ජිම ගැලවීමට හේතුව කුමක්දැයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

මැකැනියර්ස් සහ ඉංජිනේරුමහතුන් කාර්මික කමිටුවෙහි නොමැති බවත්, කරුණු සොයා බලා වාර්තාවක් පමණක් ලබාදිය හැකි බවත් , පවතින නිර්ණායක අනුව මෙම බොබ්කැට් යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා අදාළ සේවා ස්ථානයටම ලබාදිය යුතු බවත්, කාර්මික කමිටුව පරීක්ෂා කිරීමට යන විට මීට පෙර එන්ජින් එකට වතුර ගොස් ඇති නිසා එය ගලවා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එම ප්‍රකාශය සාවද්‍ය බව ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා පනත මඟින් සභාවේ භූමිකාව පැහැදිලිව දක්වා ඇති බවත්, එය අධ්‍යයනය කිරීම සියලුම මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ වගකීම බව ප්‍රකාශ කළ අතර සභා කටයුතු සිදුකරගෙන යාමේදී ඊට බාධා ඇති කිරීම මත සභා කටයුතු අඩාල වන බවත් ප්‍රකාශ කරන ලදී. යම් වංචාවක් හෝ දූෂණයක් සිදුවී ඇත්නම් ඒ සම්බන්ධව තීන්දු තීරණ ගැනීමට වෙනම ආයතන පවතින බවත් ප්‍රකාශ කරන ලදී. යන්ත්‍රයක් අලුත්වැඩියා කිරීමේ අවස්ථා දෙකක් පවතින බවත්,

01.ක්‍රියාත්මක වෙමින් පවතිද්දී සිදුවන අලුත්වැඩියා කටයුතු (Running Repaired),

මෙහිදී මිල ගණන් කැඳවීමක් සිදුකළ නොහැකි බවත්, ලියාපදිංචි අලුත්වැඩියා කිරීමේ ආයතනයක් වෙත යොමු කිරීම මෙහිදී සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී. තවද, වාහනය අලුත්වැඩියාවට යොමු කිරීමෙන් අනතුරුව සිදුවී ඇති අනතුර පිළිබඳව එම විෂය පිළිබඳව නිපුණත්වයක් ඇති පුද්ගලයකුගෙන් වාර්තාවක් ලබාගන්නා බවත්, රාජ්‍ය ආයතන සම්බන්ධ ඩිපෝ ඉංජිනේරු මහතා ඒ වාර්තාව ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

02.ප්‍රධාන අලුත්වැඩියා (Main Repaired),

විශේෂයෙන් බොබ්කැට් යන්ත්‍රය සම්බන්ධව සුළු සුළු අලුත්වැඩියාවන් සිදුකළ බවත්, නමුත් ක්‍රියාත්මක කිරීමේදී නැවත නැවත ගැටලුව ඇති වූ බැවින් නිෂ්පාදන ආයතනයට ලබාදීම තීරණය කළ බවත් ප්‍රකාශ කරන ලදී.

02.ප්‍රධාන අලුත්වැඩියා (Main Repaired),

ප්‍රධාන අලුත්වැඩියාවන් කිරීමට සිදු වුවහොත් අනිවාර්යෙන්ම නිෂ්පාදන ආයතනයට ලබාදිය යුතු බවත් පැහැදිලි කරන ලදී. තවද , සභාවේ යන්ත්‍රයක් පවතිද්දී එය අලුත්වැඩියා නොකර කුලී පදනම මත යන්ත්‍රයක් ලබා ගැනීම මත විගණන විමසුම් ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

සභාව සතුව යන්ත්‍ර පවතිද්දී කුලී පදනමට ලබා ගැනීම ගැටළු සහගත බවත්, විශේෂයෙන්ම මෙම යන්ත්‍රය අලුතවැඩියා කිරීමට ලබාදී ඇති ඇස්තමේන්තුව පිළිගත හැකිද නැද්ද ඔවුන්ගේ අලුත්වැඩියාවෙන් පසු වගකීම් කාලය කොපමණද යන්න පිළිබඳව සභාව දැනුවත් කිරීම කාර්මික කමිටුවෙහි වගකීමක් බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

සභා තීරණයක් ගැනීමට සභාවට කමිටු යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
කාර්මික කමිටු නිර්දේශ ලබාදෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
දින දෙකක් ඇතුලත් බොබ්කැට් යන්ත්‍රය සම්බන්ධ කාර්මික කමිටු නින්දේශ ලබාදෙන බව ප්‍රකාශ කරන ලදී. 02.ගලි බවුසරය සම්බන්ධ ස්ථානීය පරීක්ෂණ වාර්තාවක් ද සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ඇස්තමේන්තු ලබා ගැනීමේදී නිසි ක්‍රියා පිළිවෙලක් අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය වූ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
කාර්මික කමිටු නිර්දේශය කුමක් දැයි විමසන ලදී. තවද ,මෙම ගලි සේවාවෙන් මාසිකව ලක්ෂ 03 ට එහා ආදායමක් උපයන බවත්, මෙම සේවාව සැපයීමට නොහැකි වීම මත සභාවට විශාල ආදායමක් අහිමිවන බවත් ප්‍රකාශ කරන ලදී. තවද, ගලි බවුසරයට අදාළ අවශ්‍ය යැයි ප්‍රකාශ කරන පිරිවිතර සකස් කර දින දෙකක් ඇතුළත කමිටු නිර්දේශ ලබාදෙන ලෙසත්, විශේෂයෙන්ම උත්තරීතර වූ මහසභාව හැල්ලුවට ලක් නොකරන ලෙසත් ප්‍රකාශ කරන ලදී. රඹුක්කන සභාවේ සභාපති හැටියට තමා හොරකමක්, වංචාවක් දූෂණයක් සිදුකර ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා ඔබට හැගෙනවානම් CID හෝ FCID වැනි ආයතනවල සහාය ලබා ගත හැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**
තමා ඉලක්ක කරගෙන එවැනි ප්‍රකාශයක් සිදු කළේ කුමන කරුණක් පදනම් කරගෙන දැයි විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ඕනෑම පුද්ගලයකුට එවැනි ස්ථානයකට ගොස් තමාට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි බව ඉන් අදහස් කළ බව ප්‍රකාශ කරන ලදී.

**නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**
අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කර වැසිකිළි පහසුකම් නොමැති පවුල් සඳහා වැසිකිළි ආධාර ලබාදීමට නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව නිර්දේශ කළ අතර ඒ සම්බන්ධ සවිස්තර වාර්තාවක් සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලෙස සභා ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
2026 අයවැය මඟින් සුභසාධනය සඳහා රුපියල් ලක්ෂ 05 ක් වෙන්කර ඇති බවත්, ඒ අනුව අඩු ආදායම්ලාභීන් කීපහිපදෙනෙකු තෝරාගත් බවත්,
01.අමුද්‍රව්‍ය සභාව මැදිහත් වී ලබාදීමටත් ,
02.කම්කරු ශ්‍රමය සේවාලාභියා සපයා ගත යුතු බවත්, එසේ නොහැකි නම් සභාවේ කම්කරු මහතතුන් යෙදවීමටත්,
03.2026 නව මිල ගණන් යටතේ රු.114,360.00 ක ඇස්තමේන්තුවක් සැකසූ බවත් ප්‍රකාශ කරන ලදී.
තවද, රඹුක්කන කොට්ඨාශයේ සිටින වැසිකිළි ආධාර අවශ්‍ය පුද්ගලයින් මේ සඳහා යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

**පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාව**
❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
පරිසර හා පහසුකම් කාරක කමිටු සභාපතිතුමන් විසින් 2026.05.19 දින පැවති කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
උපකාරක පන්ති ඇතුළු දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව වෙනම ස්ථානයක් ස්ථාපිත කිරීම සම්බන්ධව සභාවාරය ආරම්භ වී දෙවන හෝ තෙවන සභා වාරයේදී තමා විසින් යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, එම යෝජනාවට සමගාමීයව මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම ගැන තමා පෞද්ගලිකව සතුටට පත්වන

බව ප්‍රකාශ කරන ලදී. එසේම ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙන ඉල්ලීමක් කළහොත් වැට දිගට දැන්වීම් පුවරු සවිකිරීමට හැකියාව ලැබෙන බවත්, ගරු කනක හේරත් මැතිතුමා සමඟ මේ සම්බන්ධව තමා සාකච්ඡා කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සම්බන්ධීකරණ කමිටුවේදී උපකාරක ගුරු මහතුන් ගෙන්වා සාකච්ඡා කර බවත්, දැන්වීම් පුවරුවල පමණක් දැන්වීම් ඇලවීමට එකඟතාවය ලබාගත් බවත් , එසේ නොකළහොත් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

**(ඍ).ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළයුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම. - නැත**

**(එ).සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරිම.**

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

36 වන යෞවන ක්‍රීඩා සමාජ තරඟාවලි සඳහා බතඹුරේ ක්‍රීඩාංගනය නොමිලේ ලබාදීම සම්බන්ධ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමන් විසින් එවා ඇති ලිපිය අනුව 2026.05.05 දින මහසභාව විසින් ලබාගත් සභා තීරණය නැවත සලකා බැලීමට සඳහා වූ යෝජනාව.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026.05.11 දින පළාත් පාලන සහකාර කොමසාරිස්තුමන් විසින් එවන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 36 වන යෞවන ක්‍රීඩා සමාජ තරඟාවලිය සඳහා ඔබ පළාත් පාලන ආයතනය සතු ක්‍රීඩාපිටි ලබාදීම සම්බන්ධව තීරණ විධිමත්ව ලබා ගන්නා ලෙස දන්වා ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මහසභා තීරණයක් ලබා ගත් බැවින් හා සභා තීරණය හැල්ලුවට ලක්කළ යුතු නොවන බැවින් එම තීරණයේම සිටීම සුදුසු බවත්, සභාගර්භයේ මන්ත්‍රීවරුන් ඉවත්ව ගොස් ඇති මොහොතක මෙවැනි යෝජනාවක් සාකච්ඡාවට ගැනීම සුදුසු නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා සම්බන්ධ වී මෙම ක්‍රීඩා උළෙල පැවැත්වෙන බවත් , මෙම ක්‍රීඩා උළෙලවල් ලාභ ලැබීමේ ව්‍යාපෘති නොවන බවත්, කොට්ඨාශයේ දරුවන්ගේ ක්‍රීඩා කුසලතාව ඔප්නැංවීමක් මෙමගින් සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී.එසේම සභාව පැත්තෙන් සභාවට ආදායමක් අහිමි වීම මත නොමිලේ ලබාදිය නොහැකි බව සාධාරණ බවත්, ආණ්ඩුකාරතුමිය මෙය සලකා බලන ලෙස දන්වා ඇති බැවින් සභාවක් හැටියට සානුකම්පිත විය යුතු බවත්, පාසල් සඳහා ද නොමිලේ ලබාදිය හැකි නම් ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම ක්‍රීඩා උළෙල සඳහා රු.18,000.00 ක මුදල් වෙන් වුවද එම මුදල් ඔවුන්ගේ ධාවනපත සැකසීම,ක්‍රීඩා උපකරණ, ක්‍රීඩකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වියදම් දැරීමේදී ප්‍රමාණවත් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. තවද, ක්‍රීඩාපිටි නොමිලයේ ලබාදීමට මහසභාව අනුමැතිය නොලැබේ නම් ඉතා කණගාටුදායක බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා

පාසල් මට්ටමින්ද මෙම සහනය ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මුදලක් මේ සම්බන්ධ වෙන්වෙලා තියෙන මොහොතක නොමිලේ ලබාදීමට තීරණය කළහොත් පාසල් මට්ටමින් ක්‍රීඩා සමාජ මට්ටමින් ඉල්ලීම් පැමිණියහොත් නොමිලයේ ලබාදීමට සිදුවන බව ප්‍රකාශ කරන ලදී. තවද, ආණ්ඩුකාරතුමිය නොමිලයේ ලබාදීමට නියෝග කර නොමැති බවත් සලකා බලන ලෙස දන්වා ඇති බවත් ප්‍රකාශ කළ අතර ඉදිරියේදී විශාල අවධානමකට සභාවක් හැටියට මුහුණ දීමට සිදුවිය හැකි බව පැහැදිලි කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ක්‍රීඩා සමාජ වලින් ක්‍රිකට් තරඟාවලි මෙම කැටගරියට දැමිය නොහැකි බවත්, එම තරඟ ව්‍යාපාරික වශයෙන් පවතින තරඟ බවත්, පාසල් මට්ටමින් පළාත් තරඟාවලදී මෙම ගැටළුවට මුහුණපාන බවත්, එහිදීද මෙම ලිපිය පාදක කරගෙන නොමිලයේ ලබාදීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

**අවසානය**

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදීන්ටත් ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 2.10 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

**සංශෝධන**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සම්ප්‍රදාය අනුව මුලින්ම තිබුණ රැස්වීමේ වාර්තාව මුලින් ඉදිරිපත් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

පිටු අංක 07 හි යථා පරිදි කල් දී ඇති යෝජනා අංක iv අදාළ තීරණය දෝෂ සහිත බවත්, එම අනතුරට අදාළව ලැබී ඇති රක්ෂණාවරණය පමණක් ගෙවීමට එකඟ වූ බවත් සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වාර්තාවේ සටහන් වී ඇති අයුරු නිවැරදි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පිටු අංක 20 හි ගරු උපසභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අදාලව තමා සංශෝධනයක් ඉදිරිපත් කළ බවත්, පිටු අංක 27 හි එම යෝජනාවට අදාල තීරණයෙහි සංශෝධිත යෝජනාව ලෙස දැක්වීම සුදුසු බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

2026.06.09 දින මාසික මහසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

සත්‍ය පිටපතකි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.